අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
**Minister of Education, Higher Education and Vocational Education**
**கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව - **2026**
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு - **2026**
General Certificate of Education (Adv. Level) Supportive Assessment-**2026**

උපකාරක තක්සේරුව
உதவி மதிப்பீடு
Supportive Assessment

සිංහල මාධ්‍යය
தமிழ் மொழி மூலம்
Sinhala Medium

# දේශපාලන විද්‍යාව
# POLITICAL SCIENCE
# அரசியல் விஞ்ஞானம்




**ප්‍රශ්න පත්‍රය I/II - வினாப்பத்திரம் I/II - Question Paper**

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
**கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**
தேசிய மொழிகள் மற்றும் சமூக விஞ்ஞான கிளை
**Ministry of Education, Higher Education and Vocational Education**
National Languages and Humanities Branch

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව - 2026
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு -2026**
General Certificate of Education (Adv.Level) Supportive Assessment - 2026

**දේශපාලන විද්‍යාව I**
அரசியல் விஞ்ஞானம் I
Political Science I

**23 | S | I**

**පැය දෙකයි**
இரண்டு மணி நேரம்
Two Hours

විභාග අංකය.........................................

**උපදෙස් :**
* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30**කින් හා **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20**කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 01 | |
| 2 | 02 - 07 | |
| 3 | 08 - 13 | |
| 4 | 14 - 19 | |
| 5 | 20 - 24 | |
| 6 | 25 - 30 | |
| 7 | 31 - 39 | |
| 8 | 40 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

1. දේශපාලනය යන සංකල්පය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලැබෙන්නේ කුමන අදහස තුළින් ද?
   (1) සමාජ ප්‍රභූන් අධිකාරී බලය යොදාගෙන කරනු ලබන ක්‍රීඩාවක් වේ.
   (2) න්‍යායාත්මක හා ප්‍රායෝගික යන පැති දෙකකින් සමන්විත වේ.
   (3) සමාජීය විද්‍යා පවුලට අයත් රාජ්‍ය හා ආණ්ඩුව කේන්ද්‍ර කරගත් සංකල්පයක් වේ.
   (4) කවුරුන්, කුමක්, කෙලෙස, කුමන අවස්ථාවකදී ලබාගන්නවාද? යන්න තීරණය කිරීමේ ක්‍රියාදාමය වේ.
   (5) ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් අතර ගැටීම තුළින් පැන නගින හොඳ හා නරක අතර අධ්‍යයනයක් වේ.

(......)

[දෙවැනි පිටුව බලන්න]

2. දේශපාලන විද්‍යාව යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

(1) පොදු යහපත උදෙසා රාජ්‍යය, ආණ්ඩුව හා ජනතාව කෙසේ ගොඩනැගිය යුතු ද? යන්න අධ්‍යයනය කිරීම වේ.
(2) බල අරගලය තුළ ප්‍රායෝගිකව නිරත වෙමින් දේශපාලනය අධ්‍යයනය කිරීමකි.
(3) ජාතික හා අන්තර්ජාතික වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් ඔස්සේ ක්‍රියාත්මක වේ.
(4) ආණ්ඩු බලය ලබාගැනීමට ක්‍රියාකාරී වීම හා ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීම මේ යටතට අයත් වේ.
(5) දේශපාලනය නමැති ප්‍රධාන කුලකයේ ඇති එක් උපකුලකයක් ලෙස සැලකේ. (......)

3. දේශපාලන විද්‍යාව තුළ අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය යොදා ගැනීමෙන් සිදුවන්නේ,

(1) ප්‍රත්‍යක්ෂ මූලික සාක්ෂි හා දත්ත මත පදනම් වූ දැනුම නිපදවීම
(2) මුළු සමාජය ම සමස්තයක් ලෙස සලකා අධ්‍යයනය කිරීම
(3) දේශපාලනයෙහි මතුපිට ප්‍රකාශන කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම
(4) දේශපාලන සංකල්පවල අර්ථ ගැඹුරින් ගවේෂණය කිරීමට යොමු වීම
(5) අවස්ථා කිහිපයක් සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීම (......)

4. ආණ්ඩුවේ ස්වභාවය පිළිබඳව වඩාත් හොඳින් පැහැදිලි කරනුයේ,

(1) සමාජයක සියලු දෙනාගේ කැමැත්ත නියෝජනය කරන ඒජන්තවරයා ලෙස සැලකේ.
(2) ස්ථාවර දෙයක් නොවන අතර රාජ්‍ය බලය ක්‍රියාවට නංවන නියෝජිතයා වේ.
(3) ප්‍රජාතන්ත්‍රවාදී වීම අනිවාර්ය ගුණාංගයක් ලෙස සැලකේ.
(4) නිශ්චිත භූමි ප්‍රදේශයකට සීමා වූ ජනතාවගේ දේශපාලන සමාජය වේ.
(5) ස්වාධිපත්‍ය බලයේ තනි උරුමකරුවා වේ.

(......)

5. අර්ධ ජනාධිපති ආණ්ඩු ක්‍රමය,

(1) ලොව ප්‍රථම වතාවට 1958 ප්‍රංශය තුළ නිර්මාණය කරයි.
(2) නාමික හා සත්‍ය යනුවෙන් විධායකයන් දෙකක පැවැත්ම සහිත ය.
(3) ආණ්ඩුවේ නායකයා වශයෙන් කටයුතු කරනු ලබන්නේ අගමැතිවරයා ය.
(4) ව්‍යවස්ථාදායකයට පිටතින් තෝරා පත් කර ගනු ලබන අමාත්‍ය මණ්ඩලයකින් සමන්විත වේ.
(5) ආණ්ඩු ක්‍රමය තුළ කිසිසේත් ම සහහැසිරීමේ තත්ත්වයක් නිර්මාණය නොවේ. (......)

6. ජනාධිපති ආණ්ඩු ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ජනාධිපතිවරයා සෘජු මහජන ඡන්දයෙන් පමණක් තේරී පත් වේ.
(2) ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ නිල කාලයන් එකිනෙකට සමගාමීව අවසන් වේ.
(3) සාමූහික වගකීමේ සංකල්පය වඩා හොඳින් ආරක්ෂා වේ.
(4) රාජ්‍ය නායකයා හා ආණ්ඩුවේ නායකයා වෙන් වෙන් වශයෙන් තේරී පත් වේ.
(5) වැඩි කාර්යක්ෂමතාවකින් හා අඩු ප්‍රජාතන්ත්‍රවාදී බවකින් යුක්ත වේ. (......)

7. ගැටුම් පරිවර්තනය තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ,

(1) ගැටුමේ ප්‍රචණ්ඩත්වය හා විනාශකාරී ප්‍රතිඵල පාලනය කිරීම ය.
(2) ගැටුමේ නිමිති, ව්‍යුහය හා අපේක්ෂිත අරමුණු වෙනස් කිරීම ය.
(3) ගැටුමේ සාධක, ඉඩකඩ හා ස්ථාන හඳුනාගෙන ඒවා උත්සන්න වීම පාලනය කිරීම ය.
(4) ගැටුම විනාශකාරී තත්ත්වයක් කරා පත් වීම පාලනය කිරීම ය.
(5) ගැටුම් සිදුවෙද්දී මතු වූ දුක්ගැනවිලිවලට ආමන්ත්‍රණය කිරීම ය. (......)

[තුන්වැනි පිටුව බලන්න]

8. "රාජ්‍යය යනු නිශ්චිත භූමි ප්‍රදේශයක් ඇතුළත බලහත්කාරී බලය සුජාත ලෙස පාවිච්චි කිරීමේ ඒකාධිකාරය තිබෙන්නේ තමන්ට පමණකැයි කියාපාන මනුෂ්‍ය ප්‍රජාවයි" යනුවෙන් ප්‍රකාශ කළ චින්තකයා වන්නේ,

(1) ඇරිස්ටෝටල් ය.
(2) තෝමස් හොබ්ස් ය.
(3) කෞටිල්‍ය ය.
(4) ජෝන් ලොක් ය.
(5) මැක්ස් වෙබර් ය.

(......)

9. "පුරවැසිභාවය" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

(1) ග්‍රීක නාගරික රාජ්‍යවල සියලු දෙනාට ම හිමි විය.
(2) ආණ්ඩුවල ස්වභාවය අනුව පුරවැසියාට හිමි තත්ත්වයෙහි වෙනසක් සිදු නොවේ.
(3) රාජ්‍යයක ප්‍රබලත්වය කෙරෙහි පුරවැසියාගේ දායකත්වය එතරම් අදාළ නොවේ.
(4) පුරවැසිභාවය පිළිබඳ තීරණ ගැනීමේ තනි අයිතිය හිමි වනුයේ රාජ්‍යයට පමණි.
(5) නූතන රාජ්‍යයන්හි පාලන කටයුතු සිදු කරනු ලබන්නේ පුරවැසියන් සියලු දෙනාගේ ම කැමැත්ත මගිනි.

(......)

10. පහත සඳහන් දේශපාලන මතවාදවලට දෙන ලද විස්තර අතුරින් එකක් පමණක් නිවැරදි ය. නිවැරදි විස්තරය අයත් දේශපාලන මතවාදය තෝරන්න.

(1) සමාජවාදී නිරාගමිකවාදය - ආගම පුරවැසි අයිතිවාසිකමක් වන අතර ආගමිකත්වය මත කිසිදු පුරවැසියෙකු වෙනස්කමකට ලක් නොකළ යුතු ය.
(2) ජනවාර්ගික ජාතිකවාදය - 'එක් ජාතියකට - එක් රාජ්‍යයක්' යන සමීකරණය මත පදනම්ව ඇත.
(3) ෆැසිස්ට්වාදය - රාජ්‍යයෙන් වෙන් වූ හා ස්වාධීන වූ පෞද්ගලික නිදහසක් හිමිකර දී ඇත.
(4) සමූහාණ්ඩුවාදය - නිදහස දිනාගත හැකි වන්නේ පුරවැසියන් සක්‍රීය හා විපරම්කාරී වීමෙනි.
(5) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය - විප්ලවීය පරිවර්තනයක් හරහා සමාජය ගොඩනැගිය යුතු බව පරම චේතනාව වේ.

(......)

11. සිවිල් සමාජ ව්‍යාපාර,

(1) මිනිසුන් ජීවත් වන පොදු වසම හා පෞද්ගලික වසම අතර ඇති අවකාශය තුළ ක්‍රියාත්මක වේ.
(2) දේශපාලන පක්ෂවලට මෙන් ම ක්‍රමානුකූල සංවිධාන ව්‍යුහ පවතී.
(3) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමවල පමණක් ක්‍රියාත්මක වේ.
(4) රටක ප්‍රජාතන්ත්‍රවාදී සෞඛ්‍ය දුර්වල කරයි.
(5) දේශපාලන පක්ෂවලට මෙන් ඍජු දේශපාලන ස්වභාවයක් නොපවතී. (......)

12. නීතියේ ආධිපත්‍යය සංකල්පයෙන් අවධාරණය කරන්නේ,

(1) පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම, වධහිංසා පැමිණ වීම ආණ්ඩුවේ ආධිපත්‍යයට යටත් කළ යුතු වීම ය.
(2) ආණ්ඩුවේ වඩාත් බලගතු පුද්ගලයින් නීතියට ඉහළින් කටයුතු කිරීම ය.
(3) මිනිසුන්ගේ පාලනය නොව නීතියේ පාලනය තහවුරු කිරීම ය.
(4) නීති සම්පාදනයට හා නීති ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවට ඇති බලය අවධාරිත කිරීම ය.
(5) පාලකයා හැර පාලිතයින් නීතියට අනුගතව හැසිරීම ය. (......)

13. සමාජවාදය,

(1) මතවාදයක් ලෙස පළමුවෙන් ම ඉදිරිපත් කරන ලද්දේ මාක්ස් හා එංගල්ස් විසිනි.
(2) ආර්ථික සම්පත්වල හිමිකරුවන් විය යුත්තේ කම්කරු පන්තිය වන බව ප්‍රකාශ කරයි.
(3) ධනවාදයට, ලිබරල්වාදයට විකල්පයක් ලෙස ඉදිරිපත් විය.
(4) ධනපති පංතිය හා නිර්ධන පංතිය ඒකාබද්ධ වීමෙන් සමාජවාදී අරගලය සිදු කළ යුතු බව ප්‍රකාශ කරයි.
(5) සමාජවාදී රාජ්‍ය බිහි කර ගැනීමෙන් පසු රාජ්‍ය සදාකාලිකව ම අවසානයට පත් වන බව පෙන්වා දෙයි.

(......)

[හතරවැනි පිටුව බලන්න]

14.පහත සඳහන් රටවල් පහේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමක්ද?

(1) බ්‍රිතාන්‍යයේ දැනට ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම මාදිලිය ඒකීය ව්‍යවස්ථා රාමුවෙන් ඉවත්ව ෆෙඩරල් රාමුව දක්වා ගමන් කර ඇත.

(2) ප්‍රංශ ආණ්ඩු ක්‍රමය විසින් පූර්ණ බලැති විධායක ජනාධිපති ධූරයක් ස්ථාපිත කර ඇති අතර පාර්ලිමේන්තුව එයට ද්විතීයික තත්ත්වයට පත් කර ඇත.

(3) ස්විට්සර්ලන්ත ආණ්ඩු ක්‍රමය තුළ ආණ්ඩු මට්ටම් අතර හවුලේ භුක්ති විදිය හැකි සමගාමී බලතල ලැයිස්තුවක් ක්‍රියාත්මක වේ.

(4) ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එහි පූර්ණ සන්ධීය ක්‍රමයක් පවතින බව ප්‍රකාශ කර ඇත.

(5) ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩු ක්‍රමය සමූහාණ්ඩුවාදී මූලධර්ම මත ගොඩනගා ඇති අතර, ජනාධිපති ඍජු මහජන ඡන්දයෙන් තෝරා ගනී. (......)

15. ස්විට්සර්ලන්ත ආණ්ඩු ක්‍රමය,

(1) 'හවුල් පාලනය' යන සිද්ධාන්තයේදී අනෙක් කැන්ටන හා සම තත්ත්වයක් අර්ධ කැන්ටනවලට ද හිමි වේ.

(2) ෆෙඩරල් ආණ්ඩුව හා කැන්ටන් අතර බලතල බෙදා හැරීම සිදුකොට ඇත්තේ කැන්ටන් ආණ්ඩු සතු බලතල දැක්වීමෙනි.

(3) කැන්ටන්වලට අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සකසා ගැනීම කැන්ටන්වලට ම පවරා ඇත.

(4) මධ්‍යම ආණ්ඩුවේ කටයුතු හා ප්‍රාන්ත කටයුතු සඳහා වෙන වෙන ම පිහිට වූ අධිකරණ ද්විත්වයක් ඇත.

(5) ෆෙඩරල් සුප්‍රීම් උසාවියට ෆෙඩරල් ආණ්ඩුව පනවන නීතිවල ව්‍යවස්ථානුකූලභාවය විමර්ශනය කිරීමට බලය ඇත. (......)

16. අන්තර් රාජ්‍ය කලාපීය සංවිධානයක් වන්නේ,

(1) ආසියාන් සංවිධානය
(2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
(3) අන්තර්ජාතික රතු කුරුස කමිටුව
(4) ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය
(5) මානව හිමිකම් විමර්ශන සංවිධානය

(......)

17. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය මඟින් ඇති කළ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය අහෝසි කළ ආණ්ඩුව වූයේ,

(1) 1956 එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව
(2) 1960 සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව
(3) 1965 ඩඩ්ලි සේනානායක ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව
(4) 1970 සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රමුඛ සමගි පෙරමුණ ආණ්ඩුව
(5) 1977 ජේ. ආර්. ජයවර්ධන ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව (......)

18. රාජ්‍ය ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

(1) විධායකයේ නායකත්වයට යටත්ව එහෙත් ස්වාධීනව ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ නිසි බලධාරී ආයතනයයි.
(2) ප්‍රතිපත්ති සම්බන්ධ නෛතික ගැටලු සඳහා ප්‍රතිනිරීක්ෂණය ලබා දීම සිදුකරයි.
(3) පොදු ගැටලු නිරාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන ආයතනයයි.
(4) ප්‍රතිපත්ති උපදේශනයට පමණක් සීමා වූ ආයතනයකි.
(5) රාජ්‍ය ප්‍රතිපත්තිවල සැබෑ ප්‍රාරම්භක කාර්යය ඉටු කරමින් එහි ප්‍රමුඛයා ලෙස කටයුතු කරයි. (......)

19. රාජ්‍යය සිය ජාතික අභිලාෂය මුදුන්පත් කර ගැනීමට බලහත්කාරී බලය භාවිතා කරන අවස්ථාවක් වන්නේ,

(1) ප්‍රචාරණය
(2) සන්ධාන ගත වීම
(3) ආක්‍රමණ
(4) ගිවිසුම් ගත වීම
(5) ණය හා ප්‍රදානයන් ලබා දීම

(......)

20. අන්තර්ජාතික දේශපාලනය,

(1) රාජ්‍යයන් ජාතික අභිලාෂ ඉටුකර ගැනීමට භාවිත කරන පිළිගත් ක්‍රියාදාමය හමුදා බලයයි.
(2) නිරන්තරයෙන් ඇති අරාජිකත්වය පාලනය කිරීම සඳහා ගෝලීය මට්ටමේ ආණ්ඩුවක ක්‍රියාකාරීත්වය දක්නට ලැබේ.
(3) පොදු නීති පද්ධතියක ක්‍රියාකාරීත්වය පවතින නිසා සෑම රාජ්‍යයක ම සාමය හා ආරක්ෂාව සහතික වී ඇත.
(4) ගෝලීයකරණය හා ගෝලීය ප්‍රවණතා වැනි තත්ත්වයන් තුළ ගතික ප්‍රපංචයක් බවට පත්ව ඇත.
(5) ලෝක සාමයේ බේරුම්කරුවා ලෙස ඇමරිකා එක්සත් ජනපදයට නෛතික තත්ත්වයක් හිමි වී ඇත.

(......)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

21. බ්‍රිතාන්‍ය යටත් විජිත සමාජ පරිවර්තන වන්නේ,

A - ධනපති හා කම්කරු යනුවෙන් සමාජ පංති විභේදනයක් ඇති වීම.
B - උඩුකුරු සමාජ සචලතාවයක් ඇති වීම.
C - කණ්ඩායම්වාදය වෙනුවට පුද්ගලවාදය අගයන සමාජ සම්බන්ධතා වර්ධනය වීම.
D - මෙරට සමාජය පටු ජනවාර්ගිකත්වයෙන් යුතුව කටයුතු කිරීමට පෙළඹීම.
E - මධ්‍යගත පාලනයක් සඳහා අවශ්‍ය පදනම වැටීම.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

22. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයාගේ බලයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ බලය සීමා වූ ආකාර වන්නේ,

A - ලංකාව සම්බන්ධයෙන් ඕනෑම අවස්ථාවක නීති පැනවීමට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට හැකි වීම.
B - ඕනෑම අවස්ථාවක රාජ්‍ය මන්ත්‍රණ සභාව විසුරුවා හැරීමට ආණ්ඩුකාරවරයාට හැකි වීම.
C - රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුමැතියකින් තොරව නීති සම්පාදනය කිරීමට ආණ්ඩුකාරවරයාට හැකි වීම.
D - රාජ්‍ය මන්ත්‍රණ සභාව සම්මත කරන සෑම පනත් කෙටුම්පතකටම ආණ්ඩුකරුගේ අනුමැතිය අත්‍යවශ්‍ය වීම.
E - ආණ්ඩුකරුගේ බලතල සම්බන්ධ ඇතැම් කරුණු සාකච්ඡා කිරීමට රාජ්‍ය මන්ත්‍රණ සභාවට නොහැකිවීම.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

23. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය,
A - පාර්ලිමේන්තුව නෛතික වශයෙන් උත්තරීතර විය.
B - ලංකාව බහුවාර්ගික හා බහුආගමික සමාජයක් බව පිළිගත්තේ ය.
C - ස්වාධීන අධිකරණයක් සහ රාජ්‍ය සේවයක් ස්ථාපිත කළේ ය.
D - සුළු ජාතීන්ට නියෝජනයක් ලබා දීම අරමුණු කරගෙන බහු මන්ත්‍රී ආසන ඇති කරන ලදී.
E - ව්‍යවස්ථාදායකය තුළ ද්විමණ්ඩලවාදය පිළිගන්නා ලදී.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

24. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය,
A - ඒකීය රාජ්‍ය ක්‍රමය පිළිගන්නා ලදී.
B - රාජ්‍ය සහ ආගම අතර ඇති සම්බන්ධතාවට ව්‍යවස්ථානුකූල පදනමක් ලබා දෙන ලදී.
C - පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථා අධිකරණය පිහිටුවන ලදී.
D - ව්‍යවස්ථාදායකය සම්මත කරන පනත් කෙටුම්පත් සඳහා අවසාන අනුමැතිය ජනාධිපතිවරයා විසින් ලබා දෙන ලදී.
E - රාජ්‍ය සේවයේ කටයුතු පිළිබඳ තීරණ ගැනීමේ බලය අමාත්‍ය මණ්ඩලයට පවරා දෙන ලදී.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

[හයවැනි පිටුව බලන්න]

25. පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

A - ඉන්දු - ලංකා ගිවිසුමේ ඍජු ප්‍රතිඵලයක් ලෙස ස්ථාපිත කරන ලදී.
B - පරිපාලන බලය සහ මධ්‍යම රජය සතු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලයේ නිශ්චිත ප්‍රමාණයන් මෙමගින් විමධ්‍යගත කර ඇත.
C - ආණ්ඩුකාරවරයා ජනාධිපතිගේ නියෝජිතයා වේ.
D - මෙහි නිල කාලය වසර හතරකි.
E - පළාත් සභාවක ජයග්‍රාහී පක්ෂයට හෝ කණ්ඩායමට ප්‍රසාද මන්ත්‍රී ආසන දෙකක් ලබා දීම සිදු වේ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන **(1), (2), (3),(4)** සහ **(5)** යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 26. | 1978 ආණ්ඩු ක්‍රමය යටතේ කථානායකවරයා පාර්ලිමේන්තුව තුළ සාමාන්‍ය ඡන්දය භාවිතා නොකරන අතර ඡන්ද සම වීමක දී තීරක ඡන්දය භාවිත කරයි. | ජනමත විචාරණයකින් සම්මත වන පනත් කෙටුම්පත් සඳහා අවසාන අනුමැතිය ජනාධිපතිවරයා විසින් ලබා දෙනු ලබයි. | (....) |
| 27. | 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව අගමැතිවරයා ධූරයෙන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට ඇත. | මේ යටතේ ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ පාර්ලිමේන්තුවට අවුරුදු 2 1/2 ගිය තැන්හිදී ය. | (....) |
| 28. | 1978 ව්‍යවස්ථාවේ 75 වන වගන්තියට අනුව අතීතයට බලපාන නීති සකස් කිරීමේ හැකියාව පාර්ලිමේන්තුවට ඇත. | පාර්ලිමේන්තුව මගින් සම්මත කළ පනත්වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ඇත. | (....) |
| 29. | දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වීමේ මෙන්ම එහිදී ඡන්දය ප්‍රකාශ කිරීමේ බලය ඇත්තේ ය. | 1978 ව්‍යවස්ථාව අනුව නීතිය මගින් පිහිටුවන ලද ඉහළම මුල් අවස්ථා අධිකරණය වන්නේ මහාධිකරණයයි. | (....) |
| 30. | 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවට ගෙන ආ දෙවන සංශෝධනය මගින් විධායක ජනාධිපති ධූරය හඳුන්වා දෙන ලදී. | 1978 ව්‍යවස්ථාව මඟින් සිදු කොට ඇත්තේ ජනාධිපතිවරයා වෙත සියලු විධායක බලතල පවරා දී එම බලතල නිදහසේ ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය වටපිටාව සකස් කිරීමයි. | (....) |

[හත්වැනි පිටුව බලන්න]

## B කොටස

31. ග්‍රීක නාගරික රාජ්‍යයන්හි ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

32. කෙනත් නිව්ටන් හා ජාන් වැන්ඩත් දේශපාලනය තුලනාත්මකව හැදැරිය යුත්තේ ඇයි? යන්නට හේතු දෙකක් ඉදිරිපත් කර ඇත. එම හේතු **දෙක** නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

33. පහත සඳහන් සංකල්පයන් ඉදිරිපත් කරන ලද දේශපාලන චින්තකයින් **දෙදෙනා** නම් කරන්න.

(1) සක්‍රීය පුරවැසියා - ..............................................................................................

(2) පුරවැසි ජීවිතය - ..............................................................................................

34. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක සත්‍ය විධායකය නියමිත කාලයට පෙර ඉවත් කළ හැකි ආකාර **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

35. ආණ්ඩුවක්, පාලන තන්ත්‍රයක් ලෙස හැඳින්වීමට බලපාන විශේෂතා **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

36. තුන්වන ලෝකයේ සමාජවාදය (Third - World Socialism) ගොඩනැඟීමට දායකත්වය ලබා දුන් දේශපාලන නායකයින් **දෙදෙනෙකු** නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

37. පහත සඳහන් ලක්ෂණ සහිත රාජ්‍ය මාදිලි නම් කරන්න

(1) පාලකයාට සුජාතභාවය ලැබී ඇත්තේ සම්ප්‍රදායෙනි.

..............................................................................................................................

(2) පාලකයාට දේශපාලන බලය උත්පාද වන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ය.

..............................................................................................................................

38. ප්‍රතිසන්ධානගත වීම මට්ටම් තුනකින් සිදුවේ. ඉන් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

39. (1). යටත් විජිත පාලන සමය තුළ මෙරටට නියෝජන සිද්ධාන්තය හඳුන්වා දීම සම්බන්ධයෙන් වැදගත් වන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක්ද?

..............................................................................................................................

(2). වගකීම් සහිත පාලන ක්‍රමයක් මෙරට නිර්මාණය වීම කෙරෙහි දායකත්වය දැක් වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක්ද?

..............................................................................................................................

[අටවැනි පිටුව බලන්න]

40. වර්තමාන ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රමයේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී නොවන අංග ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ........................................................................................................................................

(2) ........................................................................................................................................

41.(1). 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය තුළ අමාත්‍ය මණ්ඩලයේ රැස්වීම් කැඳවූයේ කවුරුන් විසින්ද ?

........................................................................................................................................

(2). 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ අමාත්‍ය මණ්ඩලයේ උපසභාපතිවරයාට රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ හිමි වූ තනතුර කුමක්ද?

........................................................................................................................................

42. මෙරට ප්‍රථම (1946) සීමා නිර්ණය කොමිසම මඟින් ඇති කළ බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස **දෙකක්** නම් කරන්න.

(1) ........................................................................................................................................

(2) ........................................................................................................................................

43. පහත සඳහන් ප්‍රකාශ මගින් හඳුන්වන දේශපාලන සංකල්පය නම් කරන්න.

(1). ආණ්ඩු බලය එක් පුද්ගලයෙකු හෝ එක් ආයතනයක් වෙත සංකේන්ද්‍රගත වීම වැළැක්වීම

........................................................................................................................................

(2). ආණ්ඩුවේ ශාඛා තුළ රාජ්‍ය බලය ප්‍රජා පීඩක ලෙස සංකේන්ද්‍රගත වීම වැළැක්වීම

........................................................................................................................................

44. රාජ්‍ය ප්‍රතිපත්ති හා බැඳුණු සංකල්ප **දෙකක්** නම් කරන්න.

(1) ........................................................................................................................................

(2) ........................................................................................................................................

45. ප්‍රංශ ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික වේ. එම මණ්ඩල **දෙක** නම් කරන්න.

(1)........................................................................................................................................

(2)........................................................................................................................................

46. 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමය තුළ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නැංවීම පාර්ශව දෙකක් යටතේ සිදු වේ. එම පාර්ශව **දෙක** නම් කරන්න.

(1) ........................................................................................................................................

(2) ........................................................................................................................................

47. 1978 ආණ්ඩු ක්‍රමය යටතේ පිහිටවනු ලැබූ පළාත් සභා ක්‍රමය තුළ විධායකය ප්‍රධාන කොටස් දෙකකි. නම් කරන්න.

(1)........................................................................................................................................

(2)........................................................................................................................................

48. ලංකා දේශපාලනය තුළ ක්‍රියාත්මක පූර්ව පක්ෂ දේශපාලන සංවිධාන **දෙකක්** නම් කරන්න.

(1)........................................................................................................................................

(2)........................................................................................................................................

49. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ හඳුන්වා දුන් අයිතිවාසිකම් පරිච්ඡේදයේ පැවති දුර්වලතා **දෙකක්** නම් කරන්න.

(1) ........................................................................................................................................

(2) ........................................................................................................................................

50. 2009 වර්ෂයේ දී ගෝලීය ආර්ථික හා දේශපාලන බලපෑම වැඩි වීම තුළ නිර්මාණය කළ 'BRICS' සංවිධානයේ සාමාජික රටවල් **දෙකක්** නම් කරන්න.

(1)........................................................................................................................................

(2)........................................................................................................................................

***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

**දේශපාලන විද්‍යාව II**
அரசியல் விஞ்ஞானம் II
Political Science II

**23 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time -10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විතය.

* **I** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, **II** කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **III** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. මිනිසා දේශපාලනය අවබෝධ කර ගන්නා ආකාර පැහැදිලි කරන්න. (ලකුණු 20)

2. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** කෙටියෙන් සාකච්ඡා කරන්න.

   (i). නව ලිබරල්වාදී රාජ්‍ය

   (ii). පශ්චාත් යටත් විජිත රාජ්‍ය

   (iii). සමාජ සම්මුතිවාදය

   (iv). සමූහාණ්ඩුවාදය (ලකුණු 10×2 = 20)

3. පහත සඳහන් ඕනෑම ආණ්ඩුක්‍රම **දෙකක** ලක්ෂණ සාකච්ඡා කරන්න.

   (i). ඒකීය ආණ්ඩු ක්‍රමය

   (ii). සන්ධිය ආණ්ඩු ක්‍රමය

   (iii).සහසන්ධීය ආණ්ඩු ක්‍රමය (ලකුණු 10×2 = 20)

[දෙවැනි පිටුව බලන්න]

## II කොටස

4. "1833 කෝල්බෲක් ආණ්ඩු ක්‍රමය පැරණි යුගයක අවසානය මෙන්ම නව යුගයක ආරම්භය සනිටුහන් කළේ ය". සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

5. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ පහත සඳහන් යෝජනා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න

(i). සර්වජන ඡන්ද බලය

(ii). රාජ්‍ය මන්ත්‍රණ සභාව

(iii). අමාත්‍ය මණ්ඩලය (ලකුණු 10×2 = 20)

6. (i). වෙස්ට්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතියෙහි දක්නට ලැබෙන ලක්ෂණ **පහක්** නම් කරන්න.

(ලකුණු 05)

(ii). 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය සහ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ රාජ්‍ය සේවයේ ක්‍රියාකාරීත්වය සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 15)

7. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකාවලින් ඕනෑ ම **දෙකක්** සාකච්ඡා කරන්න.

(i). ජනාධිපතිවරයා හා අධිකරණය

(ii). මූලික අයිතිවාසිකම්

(iii). පාර්ලිමේන්තුව

(iv).19 වන ව්‍යවස්ථා සංශෝධනය (ලකුණු 10×2 = 20)

## III කොටස

8. (i). ප්‍රංශයේ පස්වන සමූහාණ්ඩු ක්‍රමයේ දක්නට ලැබෙන ලක්ෂණ **පහක්** නම් කරන්න. (ලකුණු 05)

(ii). ඉන්දීය ආණ්ඩු ක්‍රමයේ දක්නට ලැබෙන ඒකීය ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 15)

9. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම් විස්තර කරන්න. (ලකුණු 20)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i). ජාතික බලය හා ජාතික අභිලාෂ

(ii). රාජ්‍ය ප්‍රතිපත්ති හා අධිකරණය

(iii). ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවණතා

(iv). බලපෑම් කණ්ඩායම්

(v). මැදිහත්කරණය (ලකුණු 10×2 = 20)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
**Minister of Education, Higher Education and Vocational Education**
**கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව – **2026**
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு - **2026**
General Certificate of Education (Adv. Level) Supportive Assessment-**2026**

උපකාරක තක්සේරුව - පිළිතුරු පත්‍රය
உதவி மதிப்பீடு - விடைப்பத்திரம
Supportive Assessment - Answer Sheet

සිංහල මාධ්‍යය
தமிழ் மொழி மூலம்
Sinhala Medium

# දේශපාලන විද්‍යාව
# POLITICAL SCIENCE
# அரசியல் விஞ்ஞானம்




**පිළිතුරු පත්‍රය** - விடைப்பத்திரம் - Answer Sheet

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
**கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**
தேசிய மொழிகள் மற்றும் சமூக விஞ்ஞான கிளை
**Ministry of Education, Higher Education and Vocational Education**
National Languages and Humanities Branch

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026**

# 23 - දේශපාලන විද්‍යාව

**ලකුණු බෙදීයාම**

**I පත්‍රය**

A සහ B යනුවෙන් කොටස් 02කි.

**I පත්‍රය A කොටස**

කාලය පැය 02 යි

වරණ 05 බැගින් වූ බහු වරණ ප්‍රශ්න 30කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් **මුළු ලකුණු 60 කි.**

**II පත්‍රය B කොටස**

කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40 කි.

I පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

**II පත්‍රය**

කාලය පැය 03 යි.

මෙම ප්‍රශ්න පත්‍රය I, II, III යනුවෙන් කොටස් 03 කින් යුක්තය.

I වැනි කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, II වැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, III වැනි කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ, ප්‍රශ්න 05කට පිළිතුරු ලිවිය යුතුය.

I කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 03කි.

II කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 04කි.

III කොටස - අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 03කි.

**II පත්‍රය සඳහා මුළු ලකුණු 100 කි.**

**අවසාන ලකුණු ගණනය කිරීම**

**I පත්‍රය = 100**

**II පත්‍රය = 100**

**අවසාන ලකුණ = 200 ÷ 2 = 100**

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

### දේශපාලන විද්‍යාව උපකාරක තක්සේරුව පිළිතුරු පත්‍රය - 2026

**1 පත්‍රය**

**A කොටස**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|
| 01 | **4** | 11 | **1** | 21 | **1** |
| 02 | **1** | 12 | **3** | 22 | **5** |
| 03 | **2** | 13 | **3** | 23 | **5** |
| 04 | **2** | 14 | **2** | 24 | **2** |
| 05 | **1** | 15 | **3** | 25 | **2** |
| 06 | **5** | 16 | **1** | 26 | **1** |
| 07 | **2** | 17 | **4** | 27 | **4** |
| 08 | **5** | 18 | **3** | 28 | **2** |
| 09 | **4** | 19 | **3** | 29 | **3** |
| 10 | **4** | 20 | **4** | 30 | **5** |

**B කොටස**

31. රාජාණ්ඩු
වංශාධිපති ආණ්ඩු
ප්‍රජා පීඩක ආණ්ඩු
කතිපයාධිකාරී ආණ්ඩු
ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු
රදල ආණ්ඩු

32. 1. තම රටේ දේශපාලනය මැනවින් අවබෝධ කර ගැනීමට නම් අනෙක් රටවල දේශපාලනය ගැන අවබෝධය ලබා ගැනීම වැදගත් වීම.
2. එක් එක් රටක දේශපාලන ඉතිහාසය, දේශපාලන පසුබිම සහ දේශපාලන ආයතන ගැන ලබා ගන්නා සංසන්දනාත්මක අවබෝධයකින් තොරව එම රටවල දේශපාලනය ගැන මනා අවබෝධයක් ලබා ගත නොහැකි වීම.

33. 1. ඇරිස්ටෝටල්
2. ඇලෙක්සීස් ද තොක්විල්

34. විශ්වාස භංග යෝජනාවක් සම්මත කිරීමෙන්
වාර්ෂික අයවැය ලේඛනය/විසර්ජන පනත පරාජය කිරීමෙන්
ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය / රාජාසන කතාව පරාජය කිරීමෙන්

35. සුවිශේෂී නායකත්වය
ආණ්ඩුවේ සංයුතිය
ආණ්ඩුවේ මතවාදී සංයුතිය

36. ඊජිප්තුවේ අබ්දුල් ගමාල් නසාර්
ටැන්සානියාවේ ජූලියස් නියරේරේ
ඉන්දියාවේ ශ්‍රී ජවහර්ලාල් නේරු
ඝනාවේ ක්වාමේ නිකෲමා
ඉන්දුනීසියාවේ සුකර්නෝ
පකිස්ථානයේ අලිභූතෝ

37. 1. රාජාණ්ඩු
2. ගෝත්‍රික රාජ්‍ය

38. සමාජීය ක්‍රියාමාර්ග
මනෝවිද්‍යාත්මක ක්‍රියාමාර්ග
දේශපාලන ක්‍රියාමාර්ග

39. 1.1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
2.1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

40. 1978 ආණ්ඩු ක්‍රමයෙහි ජනාධිපතිධුරය වෙත බලය සංකේන්ද්‍රගතව පැවතීම.
ව්‍යවස්ථාදායකය සහ අධිකරණය විධායකයේ බලපෑම යටතට ගෙන ඒම.
ජනාධිපතිට පූර්ණ අධිකරණ මුක්තිය ලබාදීමෙන් නීතියේ ආධිපත්‍ය බිඳ වැටීම.
මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්
ආණ්ඩුකරණ ක්‍රියාවලිය තුළ සිදු වන දූෂණ හා බලය අවභාවිතා කිරීම
සිවිල් සමාජය යුධමයකරණයට පත් වීම

41. 1. මහලේකම්වරයා
2. සභානායකධුරය

42. මැද කොළඹ
කඩුගන්නාව
බදුල්ල
බලන්ගොඩ
අම්බලන්ගොඩ - බලපිටිය

43. 1. බලතල බෙදීමේ න්‍යාය
2. සංවරණ හා තුලන සිද්ධාන්තය

44. ප්‍රතිපත්ති උපදේශනය
ප්‍රතිපත්ති නායකත්වය
ප්‍රතිපත්ති විශ්ලේෂණය

45. ජාතික සභාව
සෙනෙට් සභාව

46. පාර්ලිමේන්තුව
ජනමත විචාරණයකදී ජනතාව

47. ආණ්ඩුකාර ධුරය
මහ ඇමැති සහ ඇමති මණ්ඩලය

48. ලංකා ජාතික සංගමය
ලංකා ප්‍රතිසංස්කරණ ලීගය
කම්කරු පක්ෂය

49. අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා බහුල වීම.
මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ විට ගත යුතු ක්‍රියාමාර්ග ව්‍යවස්ථාවේ දක්වා නොතිබීම.
ජීවත්වීමේ අයිතිය මූලික අයිතියක් ලෙස දක්වා නොතිබීම

ජාතික රාජ්‍ය සභාවට 2/3 බලයකින් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සංශෝධනය කිරීමට හා ඉවත් කිරීමට බලය පැවතීම.
සිවිල් අයිතීන් කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වීම

50.

බ්‍රසීලය
රුසියාව
චීනය
දකුණු අප්‍රිකාව
රුසියාව
ඉන්දියාව
සෞදි අරාබිය
එක්සත් අරාබි එමිරේට්ස්
ඉරානය
ඊජිප්තුව
ඉතියෝපියාව

## 11 පත්‍රය පිළිතුරු

**1. මිනිසා දේශපාලනය අවබෝධ කර ගන්නා ආකාර පැහැදිලි කරන්න. (ලකුණු 20)**

මිනිසා යනු දේශපාලන සත්වයෙකි. මිනිසාගේ උපත ලියාපදිංචි කිරීමේ සිට මරණ සහතිකය දක්වාම දේශපාලන කාර්යයන්හි නිරත වේ. දේශපාලන කරුණු අවබෝධ කර ගනී. ග්‍රීක දේශපාලන දාර්ශනික ඇරිස්ටෝටල් සිය "දේශපාලනය" කෘතියෙහි දක්වා ඇත්තේ "මිනිසා යනු දේශපාලන සත්වයෙකි. දේශපාලනයෙන් තොරව ජීවත් විය හැක්කේ දෙවියන්ටත් වන සතුන්ටත් පමණි". මේ අනුව මිනිසා විවිධ ක්‍රම මගින් දේශපාලනය අවබෝධ කර ගනී. විධිමත්, අවිධිමත්, සැලසුම් කළ, සැලසුම් නොකළ ක්‍රමවලින් දේශපාලනය අවබෝධ කරගනු ලබයි. මිනිසා දේශපාලනය හදාරනු ලබන ක්‍රම දෙකකි.

- ව්‍යවහාරිකව දේශපාලනය අවබෝධ කර ගැනීම
- ශාස්ත්‍රීය ලෙස දේශපාලනය හැදෑරීම

ව්‍යවහාරිකව දේශපාලනය අවබෝධ කර ගැනීම යනු, මිනිසා තමා ජීවත්වන සමාජ පරිසරය තුළින් දේශපාලනය තේරුම් ගැනීම වේ. ගුරුවරයෙක්, මග පෙන්වන්නෙක් මෙහිදී නැත. ක්‍රමානුකූල බවක් ද නැත.
මිනිසා ව්‍යවහාරිකව දේශපාලනය අවබෝධ කරගනු ලබන කාරක වන්නේ,

පවුල, ජනමාධ්‍ය, මිත්‍ර කණ්ඩායම්, සිවිල් සමාජ සංවිධාන, දේශපාලන පක්ෂ, ආගමික සංවිධාන... ආදියයි.

ඊට අමතරව පාසල තුළ ක්‍රියාත්මකවන පහත සඳහන් විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් හරහා ද පුද්ගලයා අවිධිමත් ව නැතහොත් ව්‍යවහාරිකව දේශපාලන අවබෝධය ලබයි.

- ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන්
- නායකත්ව පුහුණු වැඩසටහන්
- ක්‍රීඩා පිටියේ ජය පරාජය විඳදරා ගැනීම්
- දේශපාලඥයන් සම්බන්ධවන උත්සව
- ජාතික ගීය ගායනා කිරීම හා ජාතික කොඩිය එසවීම්
- රැස්වීම් හා සමිති සමාගම් ආදිය තුළින් දේශපාලනය අවබෝධය ලබයි.

වාසි

- ප්‍රායෝගික දේශපාලන කරුණු අඅවබෝධ කරගැනීමට හැකිවීම
- කාලීන දේශපාලන තත්ත්වයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවීම.

අවාසි

- සාවද්‍ය දේශපාලන කරුණු සම්ප්‍රේෂණය වීම
- පක්ෂග්‍රාහී දේශපාලන කරුණු සම්ප්‍රේෂණය වීම

ශාස්ත්‍රීයව දේශපාලනය ඉගෙනීම යනු විද්‍යාත්මකව දේශපාලනය හැදෑරීම වේ. එනම් කිසියම් නීතියකට අනුව, පිළිවෙතකට අනුව, දේශපාලනය හැදෑරීම වේ. පර්යේෂණ මගින් දේශපාලනය හැදෑරීම ලෙසද එය අර්ථ දැක්විය හැකිය.

ගුරුවරයෙක්, මග පෙන්වන්නෙක්, යටතේ පාසල්, විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතනවලින් දේශපාලනය හැදෑරීම මේ යටතට අයත් වේ. පිළිගත් විෂය නිර්දේශයක් ගුරුවරුන් දේශකවරුන් යටතේ නිශ්චිත ක්‍රමවේදයකට අනුව හැදෑරීම ශාස්ත්‍රීය ක්‍රමයේදී සිදුකරයි. පාසල තුළ, පන්ති කාමරය තුළ දේශපාලන විද්‍යාව, ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය, සමාජ අධ්‍යයනය, නීතිය, ජාත්‍යන්තර අධ්‍යයනය වැනි විෂයන් යටතේ දේශපාලන කරුණු අධ්‍යයනය කරනු ලබයි.

එලෙස දේශපාලනය ඉගෙන ගැනීම තුළින්,

- සත්‍ය හා නිවැරදි දේශපාලන කරුණු ඉගෙනීමට හැකිවීම

වඩාත් සක්‍රීය දේශපාලන සත්ත්වයකු වීමට නම් මිනිසා ශාස්ත්‍රීය මෙන්ම අවබෝධයකින් යුතුව ව්‍යවහාරිකව ද දේශපාලනය ඉගෙන ගත යුතු වේ.

**2. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් කෙටියෙන් සාකච්ඡා කරන්න**

**(i). නව ලිබරල්වාදී රාජ්‍ය**

**(ii). පශ්චාත් යටත්විජිත රාජ්‍ය**

**(iii). සමාජ සම්මුතිවාදය**

**(iv). සමූහාණ්ඩුවාදය** **(ලකුණු 10×2 = 20)**

**(i). නව ලිබරල්වාදී රාජ්‍ය** **(ලකුණු 10)**

- රාජ්‍ය සුභසාධන සංකල්පය තුන් වන ලෝකයෙන් ගිලිහී යාම ආරම්භ වීමත්, සමාජවාදය ලෝක පරිහානියට පත්වීමත් නිසා ලෝක ධනවාදී ආර්ථික හා දේශපාලන බලවේගයන්ට ලොව පුරා නිරුපද්‍රිතව තහවුරු වීමට අවකාශය සැලසිණි.
- එම පසුබිමේ ජාතික රාජ්‍යයේ දේශ සීමාව ඉක්මවා වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය ශීඝ්‍ර ව්‍යාප්තියකට ලක් විය.
- මෙම මූල්‍ය ප්‍රාග්ධනය මුල් කරගත් ධනේශ්වර වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක වීම හේතු කරගෙන "ගෝලීයකරණය" සංකල්පය බිහි විය.
- 1960 දශකය වන විට රාජ්‍ය සුභසාධනවාදය ක්‍රමයෙන් අවලංගු වී කළමනාකාරී රාජ්‍ය සංකල්පය පැතිරිණ.
- මෙසේ ලිබරල් රාජ්‍ය ආණ්ඩු පාලනයට පමණක් සීමා කිරීම නව ලිබරල් රාජ්‍යයේ මූලික ලක්ෂණයක් විය.
- ධනවාදී වෙළෙඳපොළ ආර්ථිකය ජගත්කරණයට බඳුන් වීම නිසා ලෝකයේ දේශපාලන සන්දර්භය ප්‍රබල වෙනසකට ලක් විය.

- මෙවැනි තත්ත්වයක් අනුව ජාතික රාජ්‍යය හුදෙක් ම නාමමාත්‍රිකභාවයට පත් වීමත්, රාජ්‍ය ආර්ථික කටයුතුවලින් විනිර්මුක්ත වීමත් අනිවාර්ය අංගයක් විය.
- රාජ්‍යය දේශ සීමා ඉක්මවා ව්‍යාප්ත වී ඇත. වෙළෙඳපොළ හැසිරවීම සඳහා කිසිදු ප්‍රයත්නයක් දැරීමට රාජ්‍යයට අවකාශයක් නොමැත.
- මෙවැනි පසුබිමක රාජ්‍යයට පැවරී ඇති කාර්යය වන්නේ නිදහස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය සාමකාමී පරිසරයක් ස්ථාපිත කිරීම, යුක්තිය පසිඳලීම සහ කළමනාකරණය යි.
- මෙහි දී කළමනාකරණය යනුවෙන් අදහස් කළේ ධනවාදී වෙළෙඳපොළ ආර්ථිකය යථා පරිදි පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය සියලු ආකාරයේ තත්ත්වයන් සම්පාදනය කිරීම සහ මෙහෙයවීම මුල් කරගත් කළමනාකරණය යි.
- නව ලිබරල්වාදී අදහස් පළ කළ දේශපාලන චින්තකයන් අතරින් රොබට් නොසික්, ෆෙඩ්රික් වෝන් හයෙක්, මිල්ටන් ෆ්‍රීඩ්මාන් වැන්නෝ ප්‍රධාන වෙති.
- රාජ්‍යයේ බලය පොලිස් බලයකට වැඩි යමක් නොවිය යුතු ය. පුද්ගලයාගේ දේපළ පිළිබඳ අයිතිය වඩාත් වැදගත් වනවා මෙන් ම එම අයිතිය නොකෙලෙසිය යුතු බව ද ඔහු පෙන්වා දෙයි.
- දිළින්දන් වෙනුවෙන් යෝජනා කරන විසඳුම වන්නේ, රාජ්‍ය නොවන සංවිධාන මඟින් සහනාධාර ලබා දීමේ ක්‍රියා පිළිවෙත යි.
- මේ අනුව අන්තර්ජාතික අධිරාජ්‍යවාදයෙන් ආධාර ලබන රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් ලෝකය තුළ ක්‍රියාත්මක වනු දැකිය හැකි ය.
- මෙය සුභසාධක රාජ්‍යයේ තරම් පුළුල් හා පහසු මැදිහත් වීමක් නොවේ. ඒ අනුව රාජ්‍ය නිර්බාධවාදය හා සුභසාධන වාදය යන දෙකට අතරමැදි තත්ත්වයක් ලෙස අවම රාජ්‍යය හඳුනා ගත හැකි ය.

**(ii). පශ්චාත් යටත්විජිත රාජ්‍ය** **(ලකුණු 10)**

පශ්චාත් යටත් විජිත රාජ්‍ය යනු කලක් යුරෝපා රාජ්‍යයන්හි යටත් විජිතයන් ලෙස පැවත ඉන් නිදහස් වීමෙන් පසුව ඇති වූ රාජ්‍යයන් හැඳින්වීමට භාවිතා කරන න්‍යායික සංකල්පයකි.පශ්චාත් යටත් විජිත රාජ්‍ය විශේෂ රාජ්‍ය මාදිලියක් ලෙස න්‍යායික ව තර්කයක් ලෙස ගොඩනැඟුවේ පාකිස්තානු සම්භවයක් සහිත හම්සා අලාවි නම් වූ න්‍යායවේදියා ය.

1972 දී New Left Review සඟරාවේ පළ කළ, State in Post - colonial Societies: Pakistan and Bangaladesh යන රචනය ඊට පාදක විය.

හම්සා අලාවිගේ න්‍යායය සහ වෙනත් ප්‍රවේශයන් ද ඇසුරෙන් පශ්චාත් - යටත් විජිත රාජ්‍යයේ විශේෂ ලක්ෂණ මෙසේ ඉදිරිපත් කළ හැකි ය.

- පශ්චාත් - යටත් විජිත සමාජවල ඇති රාජ්‍යය, එම සමාජවල පැවති යටත් විජිත රාජ්‍ය ව්‍යුහය තව දුරටත් ඉදිරියට ගෙන යෑමක් විය.
- පශ්චාත් යටත් විජිත රාජ්‍ය බොහොමයක ම ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනය සාර්ථකව හෝ කල් පවත්නා ලෙස හෝ සිදු වී නැත.
- හමුදා කුමන්ත්‍රණවලින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍ර පෙරළා දැමීම සහ අධිකාරවාදී පාලන තන්ත්‍ර බිහි වීම මෙමෙ සමාජවල පොදු ලක්ෂණ වී තිබේ.
  උදා- මියන්මාරය, පාකිස්ථානය
- එයට ව්‍යතිරේක වී තිබෙන්නේ ඉන්දියාව සහ ලංකාව වැනි පශ්චාත් යටත් විජිත සමාජ අතළොස්සකි.
- පශ්චාත්-යටත් විජිත රාජ්‍යයේ ඇති සුවිශේෂ ලක්ෂණය නම් එම රටවල සාපේක්ෂ වශයෙන් ශක්තිමත් සහ බලසම්පන්න මිලිටරි සහ සිවිල් නිලධර ව්‍යුහයක් රාජ්‍ය තන්ත්‍රයේ කේන්ද්‍රීය ආයතන ලෙස කටයුතු කිරීම යි.
- ඒවා යටත් විජිත පාලන ක්‍රමය තුළ දී ගොඩ නඟනු ලැබූ ඒවා ය, යටත් විජිත වාදයෙන් ලැබුණු දේශපාලන නිදහස නිසා එම ව්‍යුහ වෙනස් වූයේ නැත. ඒවා දේශපාලන පක්ෂ සහ සිවිල් දේශපාලන ආයතනවලට වඩා බලසම්පන්න ය.

- දේශපාලන පක්ෂ සිවිල් දේශපාලන ආයතනවලට වඩා බලවත් ව, මිලිටරි සහ නිලධරතාන්ත්‍රික ව්‍යුහයක් මතු වීම පශ්චාත් යටත් විජිත රාජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදීත්වයට පරිවර්තනය වීමට ඇති ව්‍යුහාත්මක බාධාවක් විය.
- මෙම රාජ්‍ය තවදුරටත් සංවර්ධනය වෙමින් පවතින රටවල් ලෙස ක්‍රියාත්මක වේ.
- නවීකරණය නොවූ දේශපාලන සංස්කෘතියකට ද උරුමතම් කියයි.

**(iii). සමාජ සම්මුතිවාදය** **(ලකුණු 10)**

පශ්චාත් මධ්‍ය කාලීන යුරෝපයේ රාජ්‍ය බලය සාධාරණීකරණය සඳහා පැවති දේවවරම්වාදය බිඳ වැටීමේ පසුබිම තුළ සමාජ සම්මුතිවාදය ඉස්මතු විය. මෙතෙක් දිව්‍යමය උපතක් ලෙස සැලකූ රාජ්‍යයට සමාජයේ වටිනාකමක් ලබා දෙමින් සමාජීය උපතක් ලෙස සලකන්නට තරම් අදහසක් ඉදිරිපත් කරන්නට සමාජ සම්මුතිවාදයට හැකියාව ලැබුණි. එකී මතවාදය ඉදිරිපත් කළ පුරෝගාමීන් තිදෙනෙකු හඳුනාගත හැකිය.

- තෝමස් හොබ්ස්
- ජෝන් ලොක්
- රූසෝ

තෝමස් හොබ්ස්

රාජ්‍ය බිහිවූයේ සමාජ සම්මුතියකින් බව ප්‍රථමයෙන් ම ඉදිරිපත් කරන ලද්දේ තෝමස් හොබ්ස් විසිනි. ක්‍රි.ව. 1586-1679 අතර කාලයේ බ්‍රිතාන්‍යයේ ජීවත් වූ තෝමස් හොබ්ස් 1652 දී පළ කරන ලද, ලෙවියාතන් කෘතිය මගින් මෙම අදහස ඉදිරිපත් කරයි. හොබ්ස් තම සමාජ සම්මුතිවාදී අදහස් ඉදිරිපත් කරන්නේ සමකාලීන සමාජ ක්‍රමය පදනම් කරගෙන ය. එංගලන්තයේ රාජාණ්ඩු ක්‍රමයට විරුද්ධව ඇති වූ විප්ලවය නිසා පවතින රාජාණ්ඩු ක්‍රමය ශක්තිමත් කිරීම වෙනුවෙන් මෙම අදහස ඉදිරිපත් කර ඇත. එහිදී ඔහු සමාජය කොටස් දෙකකට බෙදා දක්වන අතර රාජ්‍ය බිහිවීමට පෙර පාලනයක් නොමැති ප්‍රකෘති තත්ත්වයක් පැවති බවත්, එම තත්ත්වය තුළ සිටි මිනිසුන් ආත්මාර්ථකාමී හා කලහකාරී පිරිසක් ලෙසත් සඳහන් කරයි. එම තත්ත්වය තුළ මිනිස් සංහතිය විනාශ වේ යැයි කල්පනා කළ මිනිසුන් තමන්ව ආරක්ෂා කර ගැනීම සඳහා සම්මුතියකට එළඹ තිබේ. එම සම්මුතියට අනුව ජනතාව සතු සියලු බලතල පාලකයාට ලබා දුන් බව තෝමස් හොබ්ස්ගේ අදහසයි. මෙම සම්මුතිය අනුව පාලකයා පාලන බලය ලබා ගැනීමත් සමග රාජ්‍ය බිහිවිය. රාජ්‍ය බිහිවීමත් සමඟ සිවිල් සමාජය නිර්මාණය වී තිබේ. එම සිවිල් සමාජය තුළ පාලකයා විසින් සම්මුතියට අනුව අසීමිත බලතල භාවිතා කරමින් මිනිසුන් පාලනය කරයි. මෙම පාලකයා කිසිවිටෙක ජනතාවට හෝ සම්මුතියට වග නොකියයි. ඔහු සම්මුතියේ කොටස්කරුවෙකු නොවේ. එමෙන්ම පාලකයාට එරෙහි වීමට ජනතාවට කිසිදු හැකියාවක් නොමැති බව ඔහු විසින් පෙන්වා දෙයි.

ජෝන් ලොක්

බ්‍රිතාන්‍ය ජාතික ජෝන් ලොක් ද රාජ්‍ය සමාජ සම්මුතියකින් බිහි වූ බව පිළිගනී. රාජ්‍ය බිහිවීමට පෙර පාලනයක් නොමැති ප්‍රකෘති තත්ත්වයක් පැවති බවත් එය අතිශය සාමකාමී එකක් වූ බවත් ඔහුගේ අදහස විය. නමුත් කල් යාම්දී එම සමාජය තුළ දේපළ මුල් කරගෙන සුළු ගැටුම් ඇතිව තිබේ. එම ගැටුම් උත්සන්න වේ යැයි සිතූ මිනිසුන් එකට එක් වී සම්මුතියකට එක්ව තිබේ. එම සම්මුතියට අනුව පාලකයාට බලය ලබා දී ඇත්තේ නීතිය හා සාමය සුරැකීම වැනි කාර්යයන් සඳහන් වූ සීමිත බලයකි. ජනතාව තම බලය සමාජයට පවරා දීම සඳහා ඇති කර ගනු ලබන ගිවිසුම සමාජ ගිවිසුම වන අතර, එය පළමුවැන්න වේ. රාජ්‍ය ගිවිසුම යනු සමාජය හා පාලකයා අතර ඇතිවන ගිවිසුමයි. පාලකයා මෙන්ම රාජ්‍ය බිහි වන්නේ ද එම ගිවිසුමේ ප්‍රතිඵලයක් වශයෙනි. ලොක්ට අනුව රාජ්‍ය බිහිවීමෙන් පසුව ගොඩනැගෙන සමාජය ඒකාධිපති හෝ සර්ව බලධාරී එකක් නොවන බැවින් සීමිත බලයක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී පාලකයෙකු ගිවිසුම මගින් බිහිවන බව ජෝන් ලොක් සඳහන් කරයි.

රූසෝ

ප්‍රංශ ජාතික රූසෝ ද 'සමාජ ගිවිසුම' නැමැති කෘතිය තුළින් රාජ්‍ය බිහිවූයේ සමාජ සම්මුතියකින් බව පිළිගනී. ඔහුද රාජ්‍ය බිහිවීමට පෙර පාලනයක් නොමැති ප්‍රකෘති තත්ත්වයක් පැවැති බවත් එය අතිශය සාමකාමී වූ බවත් සඳහන් කරයි. නමුත් පසුකාලීනව ප්‍රාග්ධනය නමැති අනාරාධිත අමුත්තා පැමිණ සමාජය තුළ ගැටුම් ඇති

කරගෙන තිබේ. එම ගැටුම් වළක්වා ගැනීමේ අරමුණින් මිනිසා සමාජ සම්මුතියකට එළඹ තිබේ. එම සම්මුතියට අනුව ගිවිසුම ඇති වන්නේ ජනතාව සහ සමස්ත සමාජය අතරයි. ඒ අනුව මිනිසුන් ස්වභාවික තත්ත්වය තුළ භුක්ති විදි බලතල ගිවිසුමක් මගින් සමස්ත සමාජයටම පවරා දෙනු ලබයි. ඒ අනුව ගිවිසුමකින් අනතුරුව බිහිවන පාලකයා සහ රාජ්‍ය යනු සමස්ත සමාජයම බව රූසෝ වැඩිදුරටත් අවධාරණය කරයි.

**(iv). සමූහාණ්ඩුවාදය** **(ලකුණු 10)**

සමූහාණ්වාදී යන සංකල්පය ලිබරල්වාදය මෙන්ම දේශපාලන මතවාදයක් වන අතර, දේශපාලන න්‍යාය හා දේශපාලන දර්ශනය යන වර්ගීකරණයට ද අයත් වේ.

දේශපාලන ප්‍රජාව, පුරවැසිභාවය, නිදහස හා දේශපාලනය පිළිබඳ සමූහාණ්ඩුවාදී අදහස් නූතන රාජ්‍ය හා එහි ස්වභාවය, අරමුණු නිර්ණය කිරීමට වැදගත් දායකත්වයක් සපයා තිබේ. ලිබරල්වාදය සහ සමූහාණ්ඩුවාදය එකිනෙකට වෙනස් දේශපාලන මතවාද නොවූවත්, ඒ දෙක අතර පවතින වෙනස්කම් හඳුනාගැනීම, එම මතවාද නිශ්චිත ව හඳුනාගැනීමට ආධාර වනු ඇත.

සමූහාණ්ඩුවාදය, දේශපාලන සංකල්පයක් ලෙසත්, දෘෂ්ටිවාදයක් ලෙසත් දිගු ඉතිහාසයකට හිමිකම් කියයි. එම ඉතිහාසය ග්‍රීක, රෝම යුගයන් දක්වා දිව යයි. සමූහාණ්ඩුවාදී අදහස්වල වර්ධනය අවධි 4 ක් යටතේ පෙන්වා දිය හැකි ය.

1. සම්භාව්‍ය සමූහාණ්ඩුවාදය
2. යුරෝපයේ පුනරුද සමයේ සමූහාණ්ඩුවාදය
3. දහ අට වැනි සියවසේ ප්‍රංශ සහ ඇමරිකානු සමූහාණ්ඩුවාදය
4. විසි වැනි සියවසේ සමූහාණ්ඩුවාදය

මෙහි මූලධර්ම කිහිපයකි.

- රාජාණ්ඩුවාදයට එකහෙළා විරුද්ධය. 18 හා 19 සියවස්වල ලිබරල්වාදයට සමාන්තරව වර්ධනය විය.
- පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා මහජනතාව වේ.
- රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තෝරාපත් කරගත යුතු බව අවධාරණය කරන අතර එකී අදහස 18 වන සියවසෙන් පසුව වර්ධනය විය.
- පුරවැසි යහගුණය ක්‍රියාත්මක වීම
- පුරවැසියන් දේශපාලන ප්‍රජාවක් ලෙස සංවිධානගතව සිටීමේ අරමුණ වන්නේ සෑම පුරවැසියෙකුටම පොදු යහපත සැලැස්වීමයි
- පුරවැසි සක්‍රීයත්වය ක්‍රියාත්මක වීම
- ලිබරල්වාදය හා සමූහාණ්ඩුවාදය එකිනෙකට සම්බන්ධ අදහස් වූවත් මෙම සංකල්පයන් දෙක අතර පවතින වෙනස පහත ලක්ෂණ තුළින්ද අවබෝධ කරගත හැකිය.
    - නිදහස
    - පුරවැසියා හා දේශපාලනය

මෙම සංකල්පයන් එකිනෙකට විග්‍රහ කර ලිබරල්වාදය හා සමූහාණ්ඩුවාදය අතර පවතින වෙනස්කම් දැක්වීම සිදුකළ යුතුය.

**03. පහත සඳහන් ඕනෑම ආණ්ඩුක්‍රම දෙකක ලක්ෂණ සාකච්ඡා කරන්න**

**(i). ඒකීය ආණ්ඩු ක්‍රමය**

**(ii). සන්ධිය ආණ්ඩු ක්‍රමය**

**(iii).සහ සන්ධීය ආණ්ඩු ක්‍රමය** **(ලකුණු 10×2 = 20)**

**(i). ඒකීය ආණ්ඩු ක්‍රමය** **(ලකුණු 10)**

රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදීම නැතිනම් ස්වාධිපත්‍ය බලය ස්ථානගත වන්නේ කොතැනද යන්න මත ආණ්ඩුක්‍රම වර්ග කිරීම හඳුනාගතත හැකිය. එහිදී ලෝකයේ පවතින ජනප්‍රියම ආණ්ඩුක්‍රම විශේෂයන් ලෙස ඒකීය හා සංධිය ආණ්ඩුක්‍රම හඳුනාගත හැකිය. ස්වාධිපත්‍ය බලය මුළුමනින්ම රැඳී පවතින්නේ මධ්‍යම ආණ්ඩුව මත නම් එවැනි ආණ්ඩුක්‍රම ඒකීය ආණ්ඩුක්‍රම ලෙස හඳුනා ගනී. ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය වැනි රාජ්‍යයන්හි ඒකීය ආණ්ඩුක්‍රම දැක ගත හැකිය.. (මුලින් ආණ්ඩු ක්‍රම පිළිබඳ කෙටි හැඳින්වීමක් කර පිළිතුර කරුණු සමග විස්තර කර තිබිය යුතුය)

**ඒකීය ආණ්ඩු ක්‍රමවල ලක්ෂණ**

- ✓ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්ම ස්වාධිපති බලය තනි මධ්‍යම ආණ්ඩුවක් වෙත කේන්ද්‍රගත කර තිබේ.

  ශ්‍රී ලංකාව,ප්‍රංශය,බ්‍රිතාන්‍ය,ඉතාලිය,ස්පාඤ්ඤය මෙයට උදාහරණ වේ.
- ✓ මධ්‍යම ආණ්ඩුව විසින් සම්මත කරන ලද පනතක් හරහා ප්‍රාදේශීය ආණ්ඩු වෙත බලය විමධ්‍යගත කර ඇත.
- ✓ ප්‍රාදේශීය ඒකක වෙත පවරා දුන් බලය ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමටත් අහෝසි කිරීමටත් මධ්‍යම ආණ්ඩුවට හැකියාව ඇත.
- ✓ භූමියෙන් කුඩා, ජනගහනය අඩු රටවලට වඩාත් යෝග්‍ය වේ.
- ✓ ජන වාර්ගික බෙදීම් අඩු රටවලට යෝග්‍ය වේ.
- ✓ සන්ධීය ආණ්ඩුවලට සාපේක්ෂව සරල හා කාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයකි.
- ✓ තනි මධ්‍යම ආණ්ඩුවක් මඟින් රාජ්‍ය පාලන කටයුතු පවත්වාගෙන යයි.
- ✓ හදිසි හා අර්බුදකාරී අවස්ථාවන්ට ඉතා හොඳින් මුහුණ දීමේ හැකියාව පවතී.
- ✓ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය බොහෝ විට ඒක මාණ්ඩලික වේ.
- ✓ ඒකීය පුරවැසිභාවයක් සහිත ය.
- ✓ සාර්ථක විදේශ ප්‍රපත්තියක් ක්‍රියාත්මක කළ හැක.
- ✓ මධ්‍යම ආණ්ඩුවේ බලය ප්‍රාදේශීය ඒකක වලට සංවරණය කල නොහැකි නිසා ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල වේ.
- ✓ සාපේක්ශ වශයෙන් කුඩා රාජ්‍යක් වන නිසා අන්තර්ජාතික වශයෙන් එල්ල වන බලපෑම් වැඩි ය.
- ✓ ඒකීය ආණ්ඩු ක්‍රියාත්මක වන්නේ බොහෝවිට භූමියෙන් කුඩා රටවල නිසා ලැබෙන භෞතික සම්පත් ප්‍රමාණය අඩුය.
- ✓ ඒකීය ආණ්ඩු ක්‍රමයක ජන වර්ග කිහිපයක් පවතින්නේ නම් ගැටුම් ඇතිවිය හැක.
- ✓ එක් මධ්‍යම ආණ්ඩුවක් පමණක් පාලන කටයුතු සිදු කරන නිසා පාලන වියදම් අඩු ය.
- ✓ තනි මධ්‍යම ආණ්ඩුවක් පවතින නිසා දේශපාලන බලය ස්ථාවර ය.
- ✓ සියලු බලතල ක්‍රියාත්මක කිරීමේ බලය ඇත්තේ මධ්‍යම ආණ්ඩුවට ය.

**(ii). සන්ධිය ආණ්ඩුක්‍රම** **(ලකුණු 10)**

රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදීම නැතිනම් ස්වාධිපත්‍ය බලයේ ස්ථානගත වන්නේ කොතැනද යන්න මත ආණ්ඩුක්‍රම වර්ග කිරීම හඳුනාගතත හැකිය. එහිදී ලෝකයේ පවතින ජනප්‍රියම ආණ්ඩුක්‍රම විශේෂයන් ලෙස ඒකීය හා සංධීය ආණ්ඩුක්‍රම හඳුනාගත හැකිය.. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ස්වාධිපත්‍ය බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු වෙත බෙදා ඇති ආණ්ඩු සන්ධිය ආණ්ඩු ලෙස හඳුන්වයි. ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, බෙල්ජියම වැනි රාජ්‍යයන්හි සන්ධිය ආණ්ඩු ක්‍රියාත්මක වේ.

**සන්ධීය ආණ්ඩුක්‍රමවල ලක්ෂණ**

- ✓ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුලින් මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාන්ත ආණ්ඩුවලට ස්වාධිපති බලය බෙදීම

  ඇමරිකාව,ඕස්ට්‍රේලියාව,ස්විටර්ලන්තය,බෙල්ජියම මෙයට උදාහරණ වේ.

- ✓ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු යන දෙකටම බෙදා දෙන බැවින් ප්‍රාන්ත ආණ්ඩුවල බලය ස්වාධීන වේ. මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත ආණ්ඩුවල බලය අහෝසි කිරීමට නොහැක.
- ✓ භූමියෙන් විශාල, රටවලට වඩාත් යෝග්‍ය වේ.
- ✓ ජන වාර්ගික බෙදීම් වැඩි රටවලට යෝග්‍ය වේ.
- ✓ සංකීර්ණ හා අකාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයකි.
- ✓ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුවල එකතුවෙන් රාජ්‍ය පාලන කටයුතු පවත්වාගෙන යයි.
- ✓ හදිසි හා අර්බුදකාරී අවස්ථාවන්ට ඉතා හොඳින් මුහුණ දීමේ හැකියාවක් නොමැත.
- ✓ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු ලෙස ආණ්ඩු මට්ටම් දෙකකි.
- ✓ ද්විත්ව පුරවැසි භාවයක් සහිත ය.
- ✓ සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අපහසු ය.
- ✓ මධ්‍යම ආණ්ඩුවේ බලය ප්‍රාන්ත ආණ්ඩුවලට පාලනය කළ හැකි නිසා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වේ.
- ✓ ප්‍රදේශ ගණනාවක් එකට එකතු කර විශාල ප්‍රමාණයේ සන්ධීය රාජ්‍යක් ගොඩනැගෙන නිසා එවැනි රාජ්‍යන්ට අන්තර්ජාතික වශයෙන් ලැබෙන පිළිගැනීම හා ආරක්ෂාව වැඩි ය.
- ✓ බොහෝවිට රාජ්‍යයට අයත් භූමිය විශාල වීම නිසා භෞතික සම්පත් විශාල ප්‍රමාණයක් ලැබෙයි.
- ✓ සාපේක්ෂ වශයෙන් ජන වර්ග අතර ගැටුම් ඇති වීම අඩුය.
- ✓ ආණ්ඩු මට්ටම් දෙකක් පවතින නිසා පාලන වියදම් වැඩිය.
- ✓ ආණ්ඩු මට්ටම් දෙකක් පවතින නිසා දේශපාලන බලය අස්ථාවර ය.
- ✓ ජාතික මට්ටමේ බලතල ලෙස සැලකෙන ජාතික ආරක්ෂාව, මුදල්, විදේශ කටයුතු වැනි වැදගත් බලතල මධ්‍යම ආණ්ඩුවට පවරා ඇති අතර කෘෂිකර්ම, අධ්‍යාපන, සෞඛ්‍ය වැනි බලතල ප්‍රාන්ත වෙත පවරා තිබේ.

**(iii). සහසන්ධීය ආණ්ඩුක්‍රම** **(ලකුණු 10)**

- සන්ධිය ක්‍රමයේ ප්‍රභේදයක් ලෙස සහසන්ධියේ ක්‍රමය දැක්විය හැකිය. සන්ධිය ආණ්ඩුක්‍රමයක මෙන්ම මධ්‍යම ආණ්ඩුවට අමතරව ප්‍රාන්ත ආණ්ඩු දක්නට ලැබේ. නමුත් විශේෂත්වය වන්නේ මධ්‍යම ආණ්ඩුවේ බලය දුර්වල කර ප්‍රාන්ත ආණ්ඩුවල බලය ඉහළ නැංවීමේ තත්ත්වයක් සහසන්ධිය ක්‍රමයේ දක්නට ලැබීමයි.
- සහසන්ධිය යන වචනයේ අර්ථය වන්නේ එකඟතාවය යන්නයි. කිසියම් වැදගත් ගැටලුවකදී ස්වාධීනව පැවති රාජ්‍යයන් සමූහයක් ගිවිසුමකින් හෝ එකඟතාවයකින් එක් රාජ්‍යයක් ලෙස කටයුතු කිරීම මෙහිදී සිදුවේ.
- ආරක්ෂාව, විදේශ සබඳතා සහ පොදු මුදල් ඒකක සම්බන්ධයෙන් ඇති වන ගැටලුවලදී මෙවැනි එකඟතාවයක් ඇතිකර ගැනීම සිදුකරගනු ලබයි. එනම් විශේෂිත අරමුණු ඉටු කර ගැනීමේ අපේක්ෂාවෙන් ස්වාධීන බලය සහිත රාජ්‍යයන් මධ්‍යම ආණ්ඩුවට සීමිත බලයක් ලබා දී ප්‍රාන්ත ආණ්ඩුවලට වැඩි බලයක් ලබා දී සහසන්ධිය ක්‍රමය ගොඩනැගීම සිදු කරයි.
- සහසන්ධිය ක්‍රමයකදී මේ ආකාරයෙන් එකතු වන ස්වාධීන රාජ්‍යයන් තම අනන්‍යතාවය අත නොහැර කටයුතු කිරීම විශේෂත්වයක් වේ.මේ නිසා ප්‍රාන්ත වලට වැඩි බලයක් සහසන්ධිය ක්‍රමයකදී හිමි වේ.

- මධ්‍යම ආණ්ඩුවට ලබාදෙන බලය තීරණය කරනු ලබන්නේ ද ප්‍රාන්ත ආණ්ඩු විසිනි. ආරම්භයේදී ගිවිසුමකින් එකට එකතු වන රාජ්‍යයන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් බලය බෙදා ගැනීම සිදුකරයි.
- පළමු අදියරේදී මධ්‍යම ආණ්ඩුවට ආරක්ෂක විදේශ කටයුතු මූල්‍ය බලතල හා අධිකරණ වැනි කටයුතු පවරා දෙයි. පළමු අදියරේදී ප්‍රාන්තවලට සෞඛ්‍ය, අධ්‍යාපන, මහා මාර්ග වැනි සුභසාධන ක්ෂේත්‍රයන්හි බලය ලබාදෙයි. ඒ අනුව පළමු අදියර අවසානයේ දී ප්‍රාන්තවලට වඩා මධ්‍යම ආණ්ඩුව බලවත් වෙයි.
- නමුත් දෙවන අදියරේදී මධ්‍යම ආණ්ඩුවේ බලතල දෙකට බෙදා එයින් කොටසක් ප්‍රාන්ත වෙත ලබාදීම සිදු කරයි. ඒ අනුව අවසානයේ දී ප්‍රාන්ත බලවත් වී මධ්‍යම ආණ්ඩුව දුර්වල වේ.
- සහසන්ධිය ක්‍රමයකට ඓතිහාසික වශයෙන් ලබා දිය හැකි උදාහරණය වන්නේ 1776 - 1787 කාලයේ ඇමරිකාවේ ජනපද 13ක් එකට එකතු වී Article of confederation ලෙස ගොඩනගන ලද ඇමරිකානු ආණ්ඩු ක්‍රමයයි.
- ඊට අමතරව මුල් කාලීනව කැනඩාව තුළද සහසන්ධිය ක්‍රමයක් පැවත තිබේ. වර්තමානයේ ස්විට්සර්ලන්තය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය මේ සඳහා ලබාදිය හැකි නිදසුන් වේ.

**04. “1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රමය පැරණි යුගයක අවසානය හා නව යුගයක ආරම්භය සනිටුහන් කළේය”. සාකච්ඡා කරන්න. (ලකුණු 20)**

ශ්‍රී ලංකාව 1505 - 1658 දක්වා පෘතුගීසීන් විසින්ද 1658 - 1796 දක්වා ලන්දේසීන් විසින්ද 1796 - 1948 දක්වා ඉංග්‍රීසින් විසින්ද තම ග්‍රහණයට හසු කරගන්නා ලදී. නමුත් මේ ජාතීන් අතරින් ලංකාව කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරනු ලැබුයේ ඉංග්‍රීසීන් විසිනි. ඉංග්‍රීසින් 1796 - 1815 තෙක් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පමණක් පාලනය කළ අතර 1815 සිට මුළු ලංකාවම තම පාලනයේ අණසකට නතු කර ගත්තේය.

ඉංග්‍රීසින් ලංකාව යටත් කරගැනීමේ ප්‍රධාන අරමුණු දෙකක් විය.

1. මව් රාජ්‍යයේ කර්මාන්තවලට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය සොයා ගැනීම.
2. මව් රාජ්‍යයේ ව්‍යවසායකයන් සඳහා වෙළඳපොළ සකසා ගැනීම.

ඒ අනුව බ්‍රිතාන්‍යයන් තම මව් රාජ්‍යයේ අවශ්‍යතාවලට අනුව ලංකාව පාලනය කිරීමට පටන් ගත් නමුත් යටත් විජිත පවත්වාගෙන යාමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉෂ්ට කරගැනීමට අසමත් බව තේරුම් ගන්නා ලදී. ඒ පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීමට කොමිසමක් ලංකාවට එවීමට තීරණය කරන ලදි. ඒ අනුව 1829 විලියම් ජී. කෝල්බෲක් සහ 1830 චාල්ස් හේ. කැමරන් යන දෙදෙනා ලංකාවට එවන ලද අතර ඔවුන් දෙදෙනා ලංකාව පුරා සංචාරය කොට විවිධ සංවිධාන සහ පුද්ගලයන්ගෙන් අදාළ තොරතුරු ඒකරාශි කොට පුළුල් වාර්තාවක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ආණ්ඩුවට ඉදිරිපත් කරනු ලදි.1833 කෝල්බෲක් කැමරන් යෝජනා නැතහොත් කෝල්බෲක් ප්‍රතිසංස්කරණය යනුවෙන් හඳුන්වන්නේ එයයි. බ්‍රිතාන්‍යයන් විසින් මෙලෙස ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීමට බලපෑ හේතු ගණනාවකි.

යටත් විජිත පවත්වාගෙන යාමේදී ආරක්ෂක සහ පරිපාලන වියදම් අඩුකර ගැනීම සහ ඍජුව විජිතය පාලනය කිරීම අපහසු වීම.

* තමන් ඉදිරියේ ඇති නව සමාජයේ ජීවන රටා සහ අභිලාෂ විජිතකාරකයාගේ සංස්කෘතිය සමඟ නොපෑහීම නිසා ඒවා වෙනස් කර ගැනීම.

* යටත් විජිත රාජ්‍ය තම මව් රාජ්‍යයේ උපරිම යහපත සඳහා යොදා ගැනීම.

ඒ අනුව කෝල්බෲක් ප්‍රතිසංස්කරණය හරහා ඉදිරිපත් කළ යෝජනා පහත සඳහන් පරිදි වේ.

* පාලන බලය මධ්‍යගත කිරීම.

* පරිපාලන පළාත් සංඛ්‍යාව සීමා කිරීම.

* රාජ්‍ය සේවය ප්‍රතිසංවිධානය කිරීම.

* ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම.

* රාජ්‍ය වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.

* රාජකාරිය ක්‍රමය අහෝසි කිරීම.

* ආණ්ඩුකාරවරයාගේ බලය සීමා කිරීම.

* ව්‍යවස්ථාදායක සහ විධායක සභාව පිහිටුවීම.

* ආණ්ඩුකරු වෙත පැවැති අධිකරණ බලතල ඉවත් කිරීම.

* මුළු දිවයිනටම බලපාන පරිදි ඒකීය අධිකරණ පද්ධතියක් පිහිටුවීම.

* යුරෝපීයයන්ගේ නඩු විභාග කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ විශේෂ අධිකරණය අහෝසි කිරීම.

* සිවිල් හා අපරාධ නඩුවල අභියාචනා පරීක්ෂා කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරීම.

* සිවිල් හා අපරාධ නඩු විභාග කිරීමේ බලය දිස්ත්‍රික් උසාවියට පැවරීම.

* සෑම ප්‍රධාන නගරයකම දිස්ත්‍රික් උසාවි පවත්වාගෙන යාම.

* අග්‍රවිනිශ්චයකාරවරයා යටතේ ස්වාධීන අධිකරණ පද්ධතියක් පිහිටුවීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයට සියලුම අධිකරණ පරිපාලනය කිරීමේ බලය පැවරීම.

ඉහත දක්වන ලද ප්‍රතිසංස්කරණ යෝජනා බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන අතර එමගින් උද්ගත වූ දේශපාලන, ආර්ථික හා සමාජ පරිවර්තන රාශියකි. බ්‍රිතාන්‍යයන් ලංකාව යටත් කරගන්නා අවස්ථාව වන විට ලංකාවේ ක්‍රියාත්මක වූයේ වැඩවසම් සමාජ ආර්ථික ක්‍රමයක් මත ගොඩනැගුණු රාජාණ්ඩුවාදී පාලන ක්‍රමයකි. මෙකී කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා හරහා ප්‍රධාන වශයෙන් ලාංකීය සමාජය ධනවාදී ආර්ථික ක්‍රමයක්, ධනවාදී සමාජ ක්‍රමයක් සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් බවට පරිවර්තනය කරන ලදි. එම පරිවර්තන පහත සඳහන් පරිදි වේ.

* වැඩවසම්වාදය බිඳ වැටීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස කුලවාදය බිඳ වැටීම.

* ජනවර්ග අතර සමගිය නැති වීම.

* පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය බිඳවැටීම.

* කණ්ඩායම්වාදය වෙනුවට පුද්ගලවාදය අගයන සමාජ සම්බන්ධතා වර්ධනය වීම.

* සමාජ සජීවීකරණය වේගවත් වීම තුළින් පීඩිත කොටස් හිස එසවීමට පටන් ගැනීම.

* 'ධනපති පන්තිය' යනුවෙන් සමාජ ආධිපත්‍යධාරී පන්තියක් බිහිවීම.

* ද්විත්ව ආර්ථිකයක් නිර්මාණය වීම.

* වාණිජ වතු වගාව ආරම්භ වීම.

* නිදහස් ශ්‍රම වෙළඳපොළක් නිර්මාණය වීම.

* යටිතල පහසුකම් ක්ෂේත්‍රය වර්ධනය වීම.

* ඉඩම් වෙළඳපොළක් නිර්මාණය වීම.

* දේශීය ව්‍යවසායක පන්තියක් බිහිවීම.

* ද්‍රව්‍යවලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීම ආරම්භ වීම.

* ආනයන අපනයන ආර්ථිකය සඳහා පදනම වැටීම.

* මධ්‍යගත පාලනය සඳහා අවශ්‍ය පදනම වැටීම.

**05. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ පහත සඳහන් යෝජනා කෙටියෙන් විස්තර කරන්න.**

**(i). සර්වජන ඡන්ද බලය**

**(ii). රාජ්‍ය මන්ත්‍රණ සභාව**

**(iii). අමාත්‍ය මණ්ඩලය** **(ලකුණු 10×2 = 20)**

**(i). සර්වජන ඡන්ද බලය** **(ලකුණු 10)**

1833 සිට මෙරට වාර්ගික නියෝජනය ක්‍රියාත්මක වූ අතර ඒ නිසාම ජන වර්ග අතර නොසන්සුන්තාවයක් ඇතිව තිබුණි. එමෙන්ම 1910 කෲව් මැකලම් ආණ්ඩු ක්‍රමය යටතේ දේපළ සහ ධනවත්කම ස්ත්‍රී පුරුෂ භාවය සලකා සීමිත ඡන්දයෙන් මන්ත්‍රීවරු තෝරාපත් කරන ක්‍රමයක් ද ලංකාව තුළ ක්‍රියාත්මක වුණි. මෙම සීමිත ඡන්ද බලය 4%ක් වැනි ප්‍රමාණයකට ලැබී තිබුණි. මේ නිසා මෙරට ප්‍රභූ කතිපයාධිකාරීත්වයක් නිර්මාණය වී තිබුණි. මෙම දුර්වලතාවය මගහරවා ගැනීම සඳහා දේපළ, ස්ත්‍රී පුරුෂ භාවය, උගත්කම සැලකිල්ලට නොගෙන අවුරුදු 21ට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම ඡන්ද අයිතිය ලබාදීමට ඩොනමෝර් කොමිසම යෝජනා කරනු ලැබීය. එහෙත් ඩොනමෝර් කොමිසම ඉදිරිපත් කළ සර්වජන ඡන්ද බල යෝජනාවට මෙර බොහෝ පාර්ශ්ව විරුද්ධ විය. ලංකා ජාතික සංගමය, ලංකා ද්‍රවිඩ සංගමය, සිංහල මහා සභාව ඒ අතර විය. නමුත් ඒ.ඊ. ගුණසිංහගේ කම්කරු සංගමය හා වික්ටර් කොරයා වැනි තරුණ කොටස් පමණක් මෙම යෝජනාවට එකග විය. බ්‍රිතාන්‍ය යටත් විජිත අතරින් ආසියාවේ සර්වජන ඡන්ද බලය ලබන පළමු රට ශ්‍රී ලංකාවයි. බ්‍රිතාන්‍යයේ ද ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම ව්‍යාප්තව ගියා වූ සර්වජන ඡන්ද බලය 1928 වර්ෂයේ දීය.

සර්වජන ඡන්ද බලය ලබාදීමෙන් ඩොනමෝර් කොමිසම බලාපොරොත්තු වූ අරමුණු කිහිපයකි.

- ලංකාව තුළ වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ඇති කිරීම
- ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ශක්තිමත් කිරීම
- වාර්ගික නියෝජනය අහෝසි කිරීම
- සංවිධානාත්මක දේශපාලන පක්ෂ ක්‍රමයක් ඇති කිරීම
- සුභසාධන රාජ්‍ය ක්‍රමයක්ි ගොඩනැගීම
- සාමාන්‍ය ජනතාවගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීම
- මෙරට ජනතාවගේ දේශපාලන සහභාගිත්වය හා දැනුම ඉහළ දැමීම
- ගම හා නගරය අතර අසමතුලිත සංවර්ධනය නැති කිරීම
- වාමාංශික ව්‍යාපාරය විප්ලවයෙන් බැහැර කරවීම

යහපත් ප්‍රතිඵල

- වගකීම් සහිත ආණ්ඩු නිර්මාණය වීම
- නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව හුරු වීම
- සුභ සාධන සේවා පුළුල් වීම
- සාමාන්‍ය ජනතාවගේ සමාජ තත්ත්වය ඉහළ යාම
- සාමාන්‍ය ජනතාවගේ දේශපාලන දැනුම ඉහළ යාම

- ජනතාවගේ දේශපාලන සහභාගිත්වය ඉහළ යාම
- සංවිධානාත්මක දේශපාලන පක්ෂ ක්‍රමයක් ඇති වීම
- ගම හා නගරය අතර පරතරය අඩුවීම
- ජන වර්ග අතර නොසන්සුන්තාව අඩුවීම
- වාමාංශික ව්‍යාපාරය විප්ලවයෙන් බැහැරවීම

අයහපත් ප්‍රතිඵල

- පටු පරමාර්ථ මත දේශපාලන පක්ෂ බිහි වීම
- වාර්ගික ගැටුම් උත්සන්න වීම
- ජනතාව සුභසාධනය මතම යැපෙන්නන් බවට පත් වීම
- දිගින් දිගට ම සුබසාධනය ලබා දීම
- ජාතික ආදායම බිඳවැටීම
- මැතිවරණ වලදී දේපළ හා ජීවිත විනාශ වීම වැනි ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් ඇති වීම

**(ii). රාජ්‍ය මන්ත්‍රණ සභාව** **(ලකුණු 10)**

- ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය රාජ්‍ය මන්ත්‍රණ සභාව යනුවෙන් හඳුන්වන ලදී.
- එය ඒක මාණ්ඩලික ආයතනයකි.
- මෙහි සභිකයින් 61 දෙනෙකි.
  - මහජන ඡන්දයෙන් -50
  - ආණ්ඩුකරුගේ නාමකරණයෙන් -08
  - රාජ්‍ය නිලධාරීන් - 03 (රාජ්‍ය ලේකම්,නීති ලේකම්,මුදල් ලේකම්)
- මෙහි නිල කාලය අවුරුදු පහක් වන අතර කථානායකවරයෙක් ප්‍රථම වරට ක්‍රියාත්මක වී ඇත. ඔහුගේ මූලාසනය යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභා සාමාන්‍ය රැස්වීම් ක්‍රියාත්මක විය.
- ව්‍යවස්ථාදායක බලය මෙන්ම විධායක බලයද රාජ්‍ය මන්ත්‍රණ සභාවට හිමිව තිබුණි. (සිසුවා විසින් කෙටියෙන් විස්තර කළ යුතු ය)
- රාජ්‍ය මන්ත්‍රණ සභාව බලතල අතින් දුර්වල ආයතනයකි.

එයට බලපෑ හේතු කිහිපයකි

- රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සම්මත වන පනත්වලට අනුමැතිය දීමේ බලය හා නිෂේධ කිරීමේ බලය ආණ්ඩුකරුට ලබා දී තිබීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන බලය රාජ්‍ය මන්ත්‍රණ සභාවට ලබා දී නොතිබීම.
- සීමිත මූල්‍ය බලතල ලබා දී තිබීම.
- රාජ්‍ය මන්ත්‍රණ සභාව ඕනෑම විටෙක විසුරුවා හැරීමේ බලය ආණ්ඩුකරු සතුවීම.

ඩොනමෝර් යුගයේ අවසාන භාගයේදී එය ඩොමීනියන් රටක ව්‍යවස්ථාදායකය තරම් බලවත් වී තිබුණි.

**(iii). අමාත්‍ය මණ්ඩලය** **(ලකුණු 10)**

- ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය තුළ ප්‍රථම වරට අමාත්‍ය මණ්ඩලයක් ඇති කර තිබුණි
- එය අමාත්‍යවරු දහ දෙනෙකුගෙන් යුක්ත විය
  - විධායක කාරක සභා හතෙහි සභාපතිවරු හත්දෙනා
  - රාජ්‍ය නිලධාරීන් තිදෙනා
- මෙම අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වූයේ මහ ලේකම්වරයා ය. අමාත්‍ය මණ්ඩල රැස්වීම් කැඳවීම මහ ලේකම්වරයා විසින් සිදු කළ යුතු අතර, උප සභාපතිවරයා ඉල්ලා සිටින අවස්ථාවලදීත් රැස්වීම් කැඳවිය යුතුය.
- සෙසු අමාත්‍යවරු අතරින් එක් අයෙක් අමාත්‍ය මණ්ඩලයේ උප සභාපති ලෙස පත් කරගෙන තිබේ. ඔහු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභානායක ද විය.
- අමාත්‍ය මණ්ඩල රැස්වීමක සණ පූර්ණය වූයේ රාජ්‍ය නිලධාරීන් තිදෙනා සහ තවත් අමාත්‍යවරු තිදෙනෙකි.
- විධායක කාරක සභාවන්හි සාමාන්‍ය සාමාජිකයෙකු ඉක්මවා ගිය බලයක් අමාත්‍යවරයකු සතු නොවුන ද, කාරක සභාවේ ඡන්ද විමසීමක දී සම ඡන්ද අවස්ථාවක තීරක ඡන්දයක් භාවිතා කිරීමේ අයිතිය අමාත්‍යවරයාට හිමි විය. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට අණ දීමේ බලය ද අමාත්‍යවරුන්ට හිමි විය.

කාර්යයන්

- රජයේ දෙපාර්තමේන්තු කටයුතු පාලනය
- නීති හා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම
- තම විධායක ක්ෂේත්‍ර නිසි ලෙස පාලනය කිරීම.

- ආරම්භයේ සිටම අමාත්‍ය මණ්ඩලය දේශීය හා විදේශීය වශයෙන් බෙදී තිබුණ තත්ත්වයක් දක්නට ලැබුණි. අනෙක් අතට දේශපාලන පක්ෂ ක්‍රමයක් එකල ලංකාවේ නොමැති වූ නිසා දේශීය අමාත්‍යවරු අතර ද එක්සත් භාවයක් නොතිබුණි. ඔවුන් සාමූහික වගකීමකින් යුතුව කටයුතු නොකරන ලදී. යම් තරමකින් හෝ ඔවුන් එක්සත්ව කටයුතු කරනු ලැබුවේ වාර්ෂික අයවැය ලේඛනය සම්මත කිරීමේ දී පමණි. කෙසේ නමුත් අවසාන භාගයේ දී ඔවුන් එක්සත්ව කටයුතු කරන ආකාරයක් ද දක්නට ලැබුණි.

**06. (i). වෙස්ට්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතියෙහි දක්නට ලැබෙන ලක්ෂණ පහක් නම් කරන්න.** **(ලකුණු 5)**

i. ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ කේන්ද්‍රීය ස්ථානය පාර්ලිමේන්තුවට හිමි වීම.
ii. පාර්ලිමේන්තුවට වග කියන කැබිනට් මණ්ඩලයක් පැවතීම.
iii. පාර්ලිමේන්තුව නෛතික වශයෙන් උත්තරීතර වීම.
iv. ආණ්ඩුව පාර්ලිමේන්තුව මඟින් පාලනය කිරීම.
v. පාර්ලිමේන්තුවෙන් පත් වූ මන්ත්‍රීන්ගෙන් ආණ්ඩුව සකස් වීම.
vi. ආණ්ඩුව පාර්ලිමේන්තුවට සාමූහික වශයෙන් වගකිව යුතු වීම.
vii. පාර්ලිමේන්තුවේ අධිකාරීත්වයට නිසැක වශයෙන් ම අභියෝග කළ නොහැකි ලෙස අධිකරණයේ භූමිකාව සීමා සහිත වීම.
viii. කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ක්‍රමය මත පදනම් වූ ද්වි පක්ෂ ක්‍රමය.

**(ii). 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය සහ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ රාජ්‍ය සේවයේ ක්‍රියාකාරීත්වය සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න.** **(ලකුණු 15)**

1947 සොල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ රාජ්‍ය සේවය හෙවත් ස්ථිර විධායකය බොහෝ දුරට දේශපාලන බලපෑම්වලින් තොරව ස්වාධීනව පවත්වාගෙන යාමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි. නමුත් 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍ය සේවය දේශපාලනීකරණය කළ තත්ත්වයක් දක්නට ලැබුණි.

සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ඉහළ ම රාජ්‍ය නිලධාරීන් අගමැති නම් කිරීමෙන් පසුව අග්‍රාණ්ඩුකරු විසින් පත් කළ යුතු වූ අතර වාර්ෂික වැටුප රුපියල් 4080ට අඩු වැටුප් ලබන රාජ්‍ය සේවකයින් පත් කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම, විනය පාලනය කිරීම හා උසස් වීම් ලබා දීම සඳහා ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් ඇති කර තිබුණි. එය සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් සමන්විත වන අතර අවුරුදු පහක කාලයක් සඳහා අගමැති විසින් නම් කිරීමෙන් පසු අග්‍රාණ්ඩුකරු විසින් පත්කළ කොමිසමකි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රාජ්‍ය නිලධාරීන් පත් කළ නොහැකි විය. දේශපාලන මැදිහත්වීම්වලින් තොරව පහළ රාජ්‍ය සේවය පාලනය කළේ මෙම රාජ්‍ය සේවා කොමිසමයි. මෙම රාජ්‍ය සේවා කොමිසමට බලපෑම් කළ නොහැකි වූ අතර බලපෑම් කරන්නෙකු රුපියල් දහසක දඩයකට, වසරක සිර දඬුවමකට හෝ මෙම දඬුවම් දෙකට ම යටත් කළ හැකි ය. නමුත් කොමිසමේ තීරණ සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමට හැකියාව තිබුණි.

මෙවැනි රාජ්‍ය සේවා කොමිසමක් පිහිටවනු ලැබුවේ,

- රාජ්‍ය සේවය ස්වාධීන කිරීම
- සුළු ජාතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ය.

නමුත් 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රමයේ රාජ්‍ය සේවය පාලනය කිරීමේ බලය අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයට ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය ජාතික රාජ්‍ය සභාවට පමණක් වගකීමට බැඳී සිටියහ. රාජ්‍ය සේවය පාලනය කිරීමේ දී අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයට උපදෙස් දීම සඳහා විශේෂිත ආයතන දෙකක් ඇති කර තිබුණි. එනම්,

- **රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය**
- **රාජ්‍ය සේවා විනය මණ්ඩලය**

**වශයෙනි. සාමාජිකයන් තිදෙනා බැගින් වූ මෙම මණ්ඩල දෙක අවුරුදු හතරක කාලයකට අගමැති නියමයෙන් ජනාධිපති විසින් පත් කරනු ලැබීය. ඒවාට ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරු හෝ රාජ්‍ය නිලධාරීන් පත් කළ නොහැකි විය. මෙම මණ්ඩල දෙකට පැවරුණු කාර්යය වූයේ අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයට රාජ්‍ය සේවකයින් පත් කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම යනාදී කටයුතුවලදී අමාත්‍ය මණ්ඩලයට උපදෙස් දීමයි. එම උපදෙස් පිළිගැනීමේ හෝ නොපිළිගැනීමේ බලය අමාත්‍ය මණ්ඩලය සතු කොට තිබුණි.**

**මේ අනුව සෝල්බරි ආණ්ඩුක්‍රමයේ රාජ්‍ය සේවය බොහෝ දුරට ස්වාධීන වූ අතර පළමු ජනරජ ආණ්ඩු ක්‍රමය තුළ රාජ්‍ය සේවය දේශපාලනීකරණය වූ තත්ත්වයක් පෙන්නුම් කරනු ලබයි.**

**07. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත මාතෘකාවලින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.**

**(i). ජනාධිපතිවරයා හා අධිකරණය**

**(ii). මූලික අයිතිවාසිකම්**

**(iii). පාර්ලිමේන්තුව**

**(iv).19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන** **(ලකුණු 10×2 = 20)**

**(i). ජනාධිපතිවරයා හා අධිකරණය** **(ලකුණු 10)**

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය තුළ යුක්තිය පසිඳලීම සඳහා අධිකරණ පද්ධතියක් නිර්මාණය කර ඇත. ඒ 1978 අංක 2 දරණ යුක්තිය පසිඳලීමේ පනත මගිනි .

ඉහළ අධිකරණ -

ශ්‍රේෂ්ඨාධිකරණය.

අභියාචනාධිකරණය

පහළ අධිකරණ -

මහාධිකරණය

දිසා අධිකරණය

මහේස්ත්‍රාත් අධිකරණය

ප්‍රාථමික උසාවි

මෙම අධිකරණ පද්ධතියේ අභ්‍යන්තරික කටයුතුවලට මැදිහත්වීමට ජනාධිපතිට බලය නැත. නමුත් අධිකරණ විනිසුරුවන් පත් කිරීම, ඉවත් කිරීම, වැරදිකරුවන්ට සමාව දීම ආදී බලතල කිහිපයක් ජනාධිපතිට හිමිකර දී ඇත.

107(1) ව්‍යවස්ථාව - ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් පත් කිරීමේ බලය

107(4) - ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් ජනාධිපති ඉදිරියේ දිවුරුම් දී වැඩ භාරගත යුතු බව.

109(1) - ඉහළ අධිකරණ විනිසුරුවන් විශ්‍රාම ගැනීමට පෙර ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව තුළ දෝෂාභියෝගයක් සම්මත වූ විටෙක විනිසුරුවන් ඉවත් කිරීමේ බලය ජනාධිපති සතු බව.

109(1) - ඉහළ අධිකරණයන්හි විනිශ්චයකාරධූරයන්හි පුරප්පාඩු ඇති වූ විට තාවකාලික පදනම මත විනිශ්චකාරවරුන් පත් කිරීම.

110(1) - ඉහළ අධිකරණයන්හි සේවයේ යුතු විනිශ්චයකරුවන් වෙනත් කාර්යයන්හි නිරත වන්නේ නම් ජනාධිපතිගේ ලිඛිත අවසරය අවශ්‍ය වීම.

110(3) - විශ්‍රාම ගත් ඉහළ අධිකරණ විනිශ්චයකාරවරුන් වෙනත් වෘත්තීන්හි නිරත වන්නේ නම් ජනාධිපතිවරයාගේ ලිඛිත අනුමැතිය අවශ්‍ය බව.

111(අ) - අධිකරණ සේවා කොමිසමේ නිර්දේශ මත මහාධිකරණ විනිසුරුවන් පත් කිරීම.

112 - අධිකරණ සේවා කොමිසමේ නිර්දේශ මත මහාධිකරණ විනිසුරුවන් ධූරයෙන් ඉවත් කිරීම.

34(1) - වැරදිකරුවන්ට සමාව දීම සහ දඬුවම් ලිහිල් කිරීම.

129(1) - ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නෛතික උපදෙස් ලබා ගැනීම.

ආදී කරුණු හරහා ජනාධිපති සහ අධිකරණය අතර සම්බන්ධතාවය නිර්මාණය වේ.

**(ii). මූලික අයිතිවාසිකම්** **(ලකුණු 10)**

මූලික අයිතිවාසිකම් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පිළිගෙන ඇති අයිතිවාසිකම් වේ. මූලික අයිතිවාසිකම් පිළිබඳ මෙරට පළමු අත්දැකීම වන්නේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. මීට පෙර ක්‍රියාත්මක වූ 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සඳහන් වූයේ සුළුජන අයිතිවාසිකම් පමණි. නමුත් 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ සඳහන් අයිතිවාසිකම්වලට වඩා පුළුල් ආකාරයෙන් අයිතිවාසිකම් ලබාදීමක් සිදුකොට ඇත.

දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 3 පරිච්ඡේදයේ 10 -14 දක්වා වගන්තිවල අයිතිවාසිකම් සඳහන්ව ඇත.(කෙටියෙන් සඳහන් කළ යුතුය)

මෙකී අයිතිවාසිකම් සියලු පුද්ගලයන්ට හිමිවන නමුත් 12(2) සහ 13 වගන්ති මගින් සහතික කරන ලද අයිතිවාසිකම් පුරවැසියන්ට පමණක් හිමිවන්නේය.10 සහ 11 යන වගන්ති මගින් සහතික කරන ලද අයිතිවාසිකම් පරම හෙවත් ඒකාන්ත අයිතිවාසිකම් ගණයට අයත් වේ.

මේ අනුව 1978 ව්‍යවස්ථාව මගින් ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමයට වඩා පුළුල් ආකාරයෙන් අයිතිවාසිකම් පිළිගෙන ඇති අතර 1972 ව්‍යවස්ථාවෙන් අයිතිවාසිකම්වලට පනවා තිබූ සීමාවන් රාශියක් ද මෙමඟින් ඉවත් කොට තිබුණි. කෙසේ නමුත් පුද්ගලයන් අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය සහ මහජන සෞඛ්‍ය සහ සදාචාරය ආරක්ෂා කිරීම, වාර්ගික සහ ආගමික සහජීවනය ඇති කිරීම ආදී විධිවිධානවලට යටත්ව අන්‍යයන්ගේද අයිතිවාසිකම් ද ආරක්ෂා වන පරිදි ය.

1972 ව්‍යවස්ථාව මගින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දී නොතිබූ නමුත් 1978 ව්‍යවස්ථාව මඟින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නෛතික යාන්ත්‍රණයක් ස්ථාපිත කොට ඇත.

- අයිතිවාසිකම් කඩවීම පිළිබඳ චෝදනා විභාග කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ලබාදීම
- ඔම්බුඩ්ස්මන්ධූරය ස්ථාපිත කිරීම.

ව්‍යවස්ථාපිත යාන්ත්‍රණය වන අතර අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව කටයුතු කිරීම සඳහා පාර්ලිමේන්තුව තුළ සම්මත කළ පනතකින් (1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත) යටතේ ය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද පිහිටුවා ඇත. මේ ආකාරයට අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු සඳහන් කොට අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය ද කෙටියෙන් විස්තර කර තිබිය යුතුය.

**(iii). පාර්ලිමේන්තුව** **(ලකුණු 10)**

වර්තමාන ආණ්ඩු ක්‍රමය යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායකය 'පාර්ලිමේන්තුව' යනුවෙන් හඳුන්වන අතර එය මන්ත්‍රීවරු 225 දෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් 196 දෙනෙකු සෘජු මහජන ඡන්දයෙන් තෝරාපත් කරගනු ලබන අතර 29 දෙනෙකු ජාතික ලැයිස්තුවෙන් තෝරාපත් කරගනු ලබයි.19 වන සංශෝධනයෙන් පසු මෙහි නිල කාලය වසර 05 කි.

මහ මැතිවරණයකින් පසු පවත්වනු ලබන පළමු පාර්ලිමේන්තු සැසිවාරයේදී මුලින්ම කථානායක,නියෝජ්‍ය කථානායක සහ නියෝජ්‍ය කාරක සභා සභාපති යන ධූරයන් සඳහා ජනතා නියෝජිතයන් තිදෙනෙකු තෝරා පත් කර ගනු ලබයි. කතානායකවරයා පාර්ලිමේන්තුවේ මුලසුන ගනු ලබන අතර, එහි සණ පූර්ණය 20කි.

පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසන් කිරීම සහ විසුරුවා හැරීම ජනාධිපතිවරයා විසින් සිදු කළ යුතු අතර වසරකට වරක් හෝ ජනාධිපති පාර්ලිමේන්තුව කැඳවිය යුතුය. ජනාධිපතිවරයා පාර්ලිමේන්තු වාරය අවසන් කරනු ලබන ප්‍රකාශනයේ ම ඊළඟ වාරය රැස්වන දිනය ද සඳහන් කළ යුතුය. එම දිනය ප්‍රකාශිත දිනයේ සිට මාස දෙකක් නොඉක්මවන දිනයක් විය යුතු ය. පාර්ලිමේන්තුව තුළ ඉදිරිපත් වන සෑම පනත් කෙටුම්පතක් ම බහුතර ඡන්දයෙන් සම්මත විය යුතු අතර එහිදී කථානායකවරයා තම ඡන්දය ප්‍රකාශ නොකරයි. නමුත් ඡන්ද සම වීමක දී තීරක ඡන්දය භාවිතා කිරීමේ හැකියාව කථානායකවරයා සතු ය.

පාර්ලිමේන්තුව සතු බලතල

- ✓ ව්‍යවස්ථාදායක බලතල
- ✓ විධායකය පාලනය කිරීමේ බලතල

- ✓ රාජ්‍ය මූල්‍ය පාලන බලතල
- ✓ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ බලය

ව්‍යවස්ථාදායක බලතල යටතේ පාර්ලිමේන්තුවට නීති සම්පාදනය කිරීමේ බලය ඇත. සාමාන්‍ය පනත් මෙන්ම මුදල් පනත් සම්මත කිරීමේ බලය ඇති අතර අදාළ බහුතරයේ ඡන්දයෙන් සම්මත වූ පසු කතානායකවරයාගේ අත්සන යෙදීමෙන් පසු එම පනත් කෙටුම්පත් නීති බවට පත් වේ.

එමෙන්ම

- අතීතයට බලපාන නීති පැනවීමේ
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසියම් විධිවිධානයක් සංශෝධනය කරන හෝ පරිච්ඡින්න කරන නීති පැනවීමේ
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යම් විධිවිධානයක් එකතු කරන නීති පැනවීමේ බලය පාර්ලිමේන්තුවට ඇත. නමුත්,
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ එහි යම් කොටසක් අත්හිටුවන්නා වූ නීතියක් හෝ
- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පනවන්නේ නම් මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින් ම පරිච්ඡින්න කරන්නා වූ නීතියක් පැනවීම කළ නොහැක.

මේ ආකාරයෙන් පාර්ලිමේන්තුව තුළින් සම්මත වූ පනත් කෙටුම්පතක් කථානායකවරයාගේ අත්සන යෙදීමෙන් පසුව නීතියක් බවට පත් වුවද ජනමත විචාරණයකදී සම්මත වන කෙටුම්පත් සඳහා ජනාධිපතිවරයා අත්සන යෙදීමෙන් පසුව නීති බවට පත්වෙයි.

විධායකය පාලනය කිරීම යටතේ ප්‍රධාන වශයෙන්ම,

- අයවැය ලේඛනය පරාජය කිරීම
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පරාජය කිරීම
- ආණ්ඩුවට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් සම්මත කිරීම

හරහා විධායකය පාලනය කළ හැකි අතර, පාර්ලිමේන්තුව තුළදී විධායකයෙන් විවිධ ප්‍රශ්න අසමින් ඔවුන් අපහසුතාවයට පත් කිරීමට ද පාර්ලිමේන්තුවට හැකියාව ඇත. ජනාධිපති සම්බන්ධයෙන් දෝෂාභියෝග ක්‍රියාවලිය වෙත යොමු විය හැකි නමුත් දෝශාභියෝගයකින් ජනාධිපතිවරයා ඉවත් කිරීමේ ක්‍රියාවලිය එතරම් පහසු නැත. රාජ්‍ය මූල්‍ය පාලන බලතල යටතේ පාර්ලිමේන්තුව විසින් අයවැය ලේඛනය සම්මත කිරීම ඇතුළු මුදල් පනත් සම්මත කිරීම දැක්විය හැකිය.

පාර්ලිමේන්තුවේ උත්තරීතර භාවය පිළිබඳ සාකච්ඡා කිරීමේදී පැහැදිලි වන්නේ, ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ ජාතික රාජ්‍ය සභාව මෙන් දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ පාර්ලිමේන්තුව උත්තරීතර ආයතනයක් නොවන බවයි. මෙම ආණ්ඩු ක්‍රමය යටතේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරන්නා වූ ආයතන දෙකක් ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දී ඇත. එනම්,

- පාර්ලිමේන්තුව
- ජනමත විචාරණයකදී ජනතාව

වශයෙනි. ඒ අනුව නීති සම්පාදනය කරනු ලබන උත්තරීතර එකම ආයතනය පාර්ලිමේන්තුව නොවේ. ඒ අනුව පාර්ලිමේන්තුවේ බලයට සීමාවන් පහත පරිදි පෙළ ගැස්විය හැකිය.

- නීති සම්පාදනය සඳහා ජනමත විචාරණය යොදා ගැනීම
- ව්‍යවස්ථාවේ සමහර වගන්ති මඟින් පාර්ලිමේන්තුවේ බලය සීමා කර තිබීම
- පාර්ලිමේන්තුවේ කටයුතු කෙරෙහි ජනාධිපතිවරයාට ඇති විශේෂ බලතල

ආදී විධිවිධාන මගින් පාර්ලිමේන්තුවේ බලය සීමා වී ඇති ආකාරය දැකගත හැකි නමුත් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන පනත්වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය නැත. එනම් අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට නැත. නමුත් එසේ වූ පමණින් ම පාර්ලිමේන්තුවේ බලය උත්තරීතර යැයි ද පැවසිය නොහැක.

**(iv).19වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය (ලකුණු 10)**

- ✓ 2015 දී බලයට පත් යහපාලන ආණ්ඩුව විසින් ජනාධිපතිවරයාගේ බලය සංවරණය කිරීම හා අගමැතිවරයාගේ බලය වැඩි කිරීම ප්‍රධාන අරමුණ කරගෙන 19 වන සංශෝධනය ඉදිරිපත් කරන ලදී. එහි සඳහන් සංශෝධන පහත පරිදි පෙළගස්වා තිබිය යුතුය.
- ✓ ජනාධිපතිවරයාගේ නිල කාලය වසර 06 සිට 05 දක්වා අඩු කිරීම.
- ✓ ජනාධිපතිවරයාට ධුරය දැරිය හැකි වාර ගණන 02 දක්වා අඩු කිරීම.
- ✓ ජනාධිපතිවරයාට රාජ්‍ය සේවයේ සහ අධිකරණ සේවයේ ඉහළ තනතුරු සඳහා පුද්ගලයන් පත් කිරීමට තිබූ බලය සංවරණය කිරීම සඳහා වන 17 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්ථාපිත කළ 18 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් අහෝසි කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත ස්ථාපිත කිරීම.
- ✓ ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලය පත් කිරීම පිළිබඳව අගමැතිවරයාගෙන් විමසිය යුතු වීම.
- ✓ ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය අමාත්‍යාංශ සහ ඔවුන්ට පවරන ලද විෂයයන් හා කාර්යයන් තීරණය කිරීම අගමැති විමසීමෙන් පසුව සිදු කළ යුතු වීම.
- ✓ කැබිනට් නොවන අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු ආදීන් පත් කිරීම අගමැතිවරයාගෙන් විමසිය යුතු වීම.
- ✓ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ කාලය අවුරුදු 01 සිට අවුරුදු 4 1/2 තෙක් දීර්ඝ කිරීම.
- ✓ ජනාධිපතිවරයාට අගමැති පත්කිරීමට හැකියාව ඇති නමුත් ඉවත් කිරීමට තිබූ හැකියාව අහෝසි කිරීම.
- ✓ ජනාධිපතිවරයාගේ කටයුතු පිළිබඳව ප්‍රශ්න කිරීමේ හැකියාව පාර්ලිමේන්තුවට හිමි කර දීම.
- ✓ ජනාධිපතිවරයාගේ අධිකරණ මුක්තිය සීමා කිරීම.
- ✓ පාර්ලිමේන්තුවේ නිල කාලය අවුරුදු 06 සිට 05 දක්වා අඩු කිරීම.
- ✓ ජනාධිපති අපේක්ෂකයෙක් වීම සඳහා තිබිය යුතු වයස් සීමාව අවුරුදු 30 සිට 35 දක්වා වැඩි කිරීම.
- ✓ ස්වාධීන කොමිෂන් සභා 10 පත් කිරීම සහ ස්වාධීන කොමිෂන් සභා සඳහා පුද්ගලයන් තෝරා පත් කිරීම සඳහා නම් නිර්දේශ කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් සිදුකළ යුතු බව දැක්වීම.
- ✓ අමාත්‍ය මණ්ඩලයේ උපරිම සංඛ්‍යාව 30ක් සහ නියෝජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව උපරිම 40ක් විය යුතු බව දැක්වීම. (ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවකදී අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව තීන්දු කිරීමේ බලය පාර්ලිමේන්තුවට පවරා දීම)
  ආදී සංශෝධන සිදු කළ බව විස්තර කොට මේ හරහා ප්‍රධාන වශයෙන් ජනාධිපතිවරයාගේ බලය අවප්‍රමාණ වූ බව දක්වා තිබිය යුතුය.

**08. (i). ප්‍රංශයේ පස්වන සමූහාණ්ඩු ක්‍රමයේ දක්නට ලැබෙන ලක්ෂණ පහක් නම් කරන්න (ලකුණු 05)**

1. ජනාධිපති හා අගමැති ඇතුළු ඇමති මණ්ඩලයකින් සමන්විත ද්විත්ව විධායකයක් පැවතීම
2. පූර්ණ බලැති විධායක ජනාධිපති ධුරයක් නිර්මාණය කර පාර්ලිමේන්තුව දෙවැනි තත්ත්වයට පත් කිරීම
3. ද්විමාණ්ඩලික පාර්ලිමේන්තුවක් පැවතීම
4. අධිකරණ කවුන්සලයකින් සමන්විත උත්තරීතර අධිකරණ පද්ධතියක් පැවතීම
5. පරිපාලන බලය විමධ්‍යගත කිරීම
6. ජනමත විචාරණ ක්‍රමය
7. ලිඛිත හා අනම්‍ය ආණ්ඩු ක්‍රමයක් පැවතීම

**(ii). ඉන්දීය ආණ්ඩු ක්‍රමයේ දක්නට ලැබෙන ඒකීය ලක්ෂණ පැහැදිලි කරන්න (ලකුණු 15)**

1950 ජනවාරි 26 ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ධ සංඝීය ආණ්ඩුක්‍රමයක් ලෙස දේශපාලන විචාරකයන් විසින් හඳුන්වනු ලබයි. එය සන්ධීය ලක්ෂණ මෙන්ම ඒකීය ලක්ෂණවලින් යුක්ත ආණ්ඩුක්‍රමයක් වේ. එහි පවතින ඒකීය ලක්ෂණ පහත පරිදි පෙන්වා දිය හැක.

- ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් පැවතීම.
  - මධ්‍යම ආණ්ඩුවට විෂය ක්ෂේත්‍ර 97ක බලතල ද
  - ප්‍රාන්ත ආණ්ඩුවලට විෂය ක්ෂේත්‍ර 67ක බලතල ද
  - සමගාමී බලතල 47ක් ද

වශයෙන් බලතල බෙදා දක්වා ඇති අතර මුදල්,විදේශ කටයුතු,ආරක්ෂාව,අන්තර් ප්‍රාන්ත වෙළඳාම, බැංකු හා රක්ෂණ ආදී බලතල මධ්‍යම ආණ්ඩුවට ලබා දී ප්‍රාන්තවලට වඩා වැඩි බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහාම මධ්‍යම ආණ්ඩුවට ලබා දී ඇත.

- හදිසි අවස්ථා බලතල යටතේ ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්තවල බලය සීමා කිරීමට හැකියාව පවතී.

  - ජාතික හදිසි අවස්ථාව. (352 වගන්තිය
  - මූල්‍ය හදිසි අවස්ථාව. (356 වගන්තිය)
  - ප්‍රාන්ත හදිසි අවස්ථාව. (360 වගන්තිය)

- ඒකීය පුරවැසිභාවයක් ලබා දී තිබීම.
- මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවේ ප්‍රාන්ත නියෝජනය කරන රාජ්‍ය සභාවේ බලතල අඩු අතර ඊට සාපේක්ෂව ලෝක් සභාවේ බලය ඉහළ මට්ටමක පැවතීම.

  උදා - මුදල් පනත් සම්මත කිරීමට රාජ්‍ය සභාවට බලය නොමැති වීම.

- නව ප්‍රාන්ත පිහිටුවීමට හා නම් කිරීමට මධ්‍යම ආණ්ඩුවට බලය පැවතීම.
- ප්‍රාන්ත පනවන පනත් නිෂේධනය කිරීමට මධ්‍යම ආණ්ඩුවට බලය පැවතීම.

මේ අනුව යුද්ධ කාලවලදී අර්බුධකාරී අවස්ථාවලදී ඒකීය වන රාජ්‍යයක් ලෙස ඉන්දියාව දැක්විය හැකිය.අර්බුදකාරී අවස්ථාවලදී මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත බලයද ලබා ගනිමින් බලවත් වීමට හැකියාවක් පවතින බව විස්තර කර තිබිය යුතුය.

**09. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සම්න්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින අත්දැකීම් විස්තර කරන්න (ලකුණු 20)**

- ලෝකයේ විවිධ පාලන ආකෘති පවතී.රාජාණ්ඩු මාදිලිය, රදල ආණ්ඩු මාදිලිය, පැසිස්ට්වාදී මාදිලිය, මිලිටරි පාලන ආකෘතිය, ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ආදිය මේ අතර වේ.
- මින් වඩාත් ම ජනප්‍රිය පාලන ක්‍රමය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි.
- දීර්ඝ කාලයක් රාජාණ්ඩු පාලනයක් පැවති ශ්‍රී ලංකාව, ප්‍රජාතන්ත්‍රවාදයට පය ඔසවන්නේ යටත් විජිත පාලන සමයේ ය.
- කෝල්බෲක් ආණ්ඩු ක්‍රමය විසින්, ලිබරල් ආර්ථිකයක් හඳුන්වා දීම,වාණිජ වතු වගාව ආරම්භ කිරීම, රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම, නිදහස් ශ්‍රම වෙළඳපොළක් ඇති කිරීම, ඒකීය නීති පද්ධතියක පැවැත්ම තහවුරු කිරීම,විශේෂයෙන් ව්‍යවස්ථාදායක සභාවක් සහ විධායක සභාවක් නිර්මාණය කිරීම සිදුවිය. ඒත් සමගම ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයක් සඳහා අවශ්‍ය මූලික සැකිල්ල, ලංකාව තුළ නිර්මාණය විය.
- 1910 - කෲව් මැකලම් ආණ්ඩු ක්‍රමය විසින් සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලදී. මේ මගින් ව්‍යවස්ථා දායක සභාවට සභිකයින් සිව් දෙනෙකු තෝරාපත් කර ගන්නා ලදී. මෙය ප්‍රමාණවත් නොවුණත්, ප්‍රජාතාන්තික ආණ්ඩු කරණය උදෙසා මහ එළිපෙහෙළි කිරීමකි.
- 1920 - මැනිං ආණ්ඩු ක්‍රමය මගින් සීමිත ඡන්ද බලය තුළින් සභිකයින් 16 දෙනෙකු තෝරා පත් කර ගැනීම ද වැදගත් වේ.
- 1924 - මැනිං ආණ්ඩු ක්‍රමය මගින් සභිකයින් 29 දෙනෙකු තෝරාපත් කර ගන්නා ලදි.
- ප්‍රජාතාන්තික ආණ්ඩුකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වැදගත් ම අවස්ථාව එළඹෙන්නේ, 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයත් සමග ය .
- සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම, රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම, විධායක කාරක සභා ක්‍රමයක් ඇති කිරීම, අමාත්‍ය මණ්ඩලය පිහිටුවීම, වාර්ගික නියෝජනය අහෝසි කිරීම, ආණ්ඩුකාරවරයාගේ බලය අඩු කිරීම, ආදී යෝජනා මෙහිදී ප්‍රධාන වේ.
- 1947 - සෝල්බරි ආණ්ඩු ක්‍රමය වූ කලී ලංකාවේ ප්‍රජාතාන්තික ආණ්ඩුකරණයේ කූඨප්‍රාප්තියයි. ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පිහිටුවීම, නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම, ස්වාධීන අධිකරණයක්

පිහිටුවීම, රාජ්‍ය සේවය ස්වාධීන කිරීම, බලතල බෙදීම පදනම් කරගැනීම, සීමිත ආණ්ඩු සංකල්පය පිළිගැනීම මෙහිදී ඉතා වැදගත් වේ.

- 1950,1960,1970 දශකවල දී ශ්‍රී ලංකාවේ ඇති වූ ද්‍රවිඩ හර්තාලය, 71 තරුණ කැරැල්ල නිසා ප්‍රජාතාන්ත්‍රිකභාවයට හානි සිදුවිය.
- 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය විසින් ද, ප්‍රජාතාන්තික ආණ්ඩුකරණය දුර්වල කළේය. සමස්ත රාජ්‍ය බලයම ජාතික රාජ්‍ය සභාව නම් වූ ඒක මාන්ඩලික ව්‍යවස්ථා දායකය වෙත සංකේන්ද්‍රණය කළේය.
- 1978 - දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමය විසින් ප්‍රජාතන්ත්‍රවාදය තවත් දුර්වල කළේය.
- විධායක ජනාධිපතිවරයා වෙත ව්‍යවස්ථාමය අධිකාරි බලයක් ගොනුකර තිබීම.
- මෙය ප්‍රජාතන්ත්‍රවාදය ආපස්සට හැරවීමක් බව බොහෝ විචාරකයෝ පෙන්වා දුන්හ.
- ප්‍රජාතන්ත්‍රවාදයේ අපගමනයක්!(නීල් ඩිවොට්ටා) ප්‍රජාතන්ත්‍රවාදයේ ආපස්සට යාමක්!(මික් මුවර්)
- නිතිපතා මැතිවරණ පැවැත්වීම මැතිවරණවලදී ජනතා සහභාගිත්වය ඉහළ මට්ටමක පැවතීම, ස්වාධීන අධිකරණ පද්ධතියක් පැවතීම ,මූලික අයිතිවාසිකම් පැවතීම නිසා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වුණි.
- ජනාධිපතිවරයා සතුව අධික බලයක් පැවතීම,ව්‍යවස්ථාදායකය සහ අධිකරණය ජනාධිපතිවරයා යටතට ගෙන පැවතීම, දේශපාලන ප්‍රචණ්ඩත්වය පැවතීම, දූෂණය හා නාස්තිය ඉහළ මට්ටමක පැවතීම ,හදිසි නීතිය ක්‍රියාත්මක වීම වැනි කාරණා ප්‍රජාතන්ත්‍රවාදයට අභියෝගයක් වේ.
- මේ කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවට අවශ්‍ය වන්නේ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයක්මය.වසර සියයකට ආසන්න කාලයක් තිස්සේ වර්ධනය වූ ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන් පැවතීම, ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු ආගමික ,බහු සංස්කෘතික ජන සමාජයක් වීම,ජනතාවගේ දේශපාලන විඥානය, දේශපාලන සහභාගිත්වය, ඉහළ මට්ටමක පැවතීම,අන්තගාමී පිරිස් අඩු මට්ටමක පැවතීම වැනි කාරණා නිසා ශ්‍රී ලංකාවට ගැලපෙන්නේ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයක්මය.
- ඉහත සියල්ල සලකා බැලූ කළ, ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය සම්බන්ධයෙන් වන අත්දැකීම, ජයග්‍රහණ, පසුබෑම් හා පුනර්ජීවන ඇතුළත් මිශ්‍ර එකක් බව කිව යුතුම ය.

**10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

**(i). ජාතික බලය හා ජාතික අභිලාෂ**

**(ii). රාජ්‍ය ප්‍රතිපත්ති හා අධිකරණය**

**(iii). ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවනතා**

**(iv). බලපෑම් කණ්ඩායම්**

**(v). මැදිහත්කරණය** **(ලකුණු 10×2 = 20)**

**(i). ජාතික බලය හා ජාතික අභිලාෂ** **(ලකුණු 10)**

නූතන ලෝකයේ පවතින්නේ ජාතික රාජ්‍ය ක්‍රමයයි, 'එක් ජාතියකට - එක් රාජ්‍යයක්' යන මූලධර්මය පදනම් කරගනිමින් ජාතික රාජ්‍ය ක්‍රමය බිහි වී ඇත. මෙකී කිසිඳු ජාතික රාජ්‍යයකට නූතන ලෝකයේ තනිව ජීවත් විය නොහැක. මේ නිසා සෑම රාජ්‍යයකටම ජාත්‍යන්තර සමාජයේ සැරි සැරීමට සිදුවේ. ජාත්‍යන්තර දේශපාලනයේ නියුක්ත වීමේ දී සෑම රාජ්‍යයකටම , ජාතික බලය යන කාරණාව අතිශය වැදගත් වේ. ජාතික බලය යන්නෙන් අදහස් වන්නේ රාජ්‍යයකට තවත් රාජ්‍යයක මනස සහ ක්‍රියාවන් පාලනය කිරීමට ඇති හැකියාවයි. මේ පිළිබඳව අදහස් දක්වන හැන්ස් ජේ. මෝර්ගන්තෝ නම් දේශපාලන විචාරකයා එය පහත පරිදි පෙන්වා දෙයි.

කිසියම් රාජ්‍යයක කැමැත්ත තවත් රාජ්‍යයක් මත පතිත කරවමින් තමන්ට අවශ්‍ය ආකාරයට එම රාජ්‍ය හසුරුවා ගැනීමට සහ එයට අවනත නොවන විට, බලපෑම් කිරීම මඟින් අවනත කර ගැනීමට ඇති හැකියාව ජාතික බලය ලෙස හැඳින්වේ. -හැන්ස් ජේ. මෝගන්තෝ -

නූතනයේ පවතින කිසිම රාජ්‍යයක් ස්වයංපෝෂිත නැත. ඒ නිසා සිය රටේ ජාතික අභිලාෂ මුදුන් පමුණුවා ගැනීමට සෑම රාජ්‍යකටම ජාත්‍යන්තර දේශපාලනයේ නියුක්ත වීමට සිදු වේ. අනෙක් අතට තම රටේ ජාතික අරමුණු හෙවත් ,ජාතික අභිලාෂ , ඉටුකර ගැනීමට ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීම අනිවාර්ය වේ.

ජාතීන් සිය දේශපාලන හැසිමේ දී දීර්ඝ කාලීන වශයෙන් සිය ආරක්ෂාව සලසා ගැනීමටත්, සෞභාග්‍ය පිණිස දරන්නා වූත් අභිලාෂයන් හා ආශාවන් ජාතික අභිලාෂ වේ. මෙම ජාතික අභිලාෂ දේශපාලන, ආර්ථික, සමාජීය හෝ සංස්කෘතික අභිලාෂ විය හැකි ය.

ජාත්‍යන්තර දේශපාලනයේ දී භාවිත කරන ජාතික බලය සහ ජාතික අභිලාෂ ය අදහස්වල සම්බන්ධතාවක් පවතී. එය පහත ප්‍රකාශයන් පැහැදිලි වේ.

ජාතික අභිලාෂ යනු ජාතික බලයේ ප්‍රකාශනයකි.

රාජ්‍යයක ජාතික බලය ගොඩනැගීම සාධක කිහිපයක සංයෝගයකින් සිදු වේ.

- ස්වභාවික සාධක (රටේ පිහිටීම, ජනගහනය, ස්වභාවික සම්පත)
- දේශපාලන සාධක (ආණ්ඩුවේ ස්වභාවය, නිලබල ක්‍රමය)
- සමාජ හා මතවාදීමය සාධක (ජාතික මතවාද, ජාතික අනන්‍යතාව)
- විද්‍යා හා තාක්ෂණ සාධක (කාර්මික හැකියාව, මිලිටරි බලය)
- බාහිර හා වෙනත් සාධක (රටේ කීර්තිය, රහස් ඔත්තු සේවාව, රටේ නම්බුව)

ජාතික බලය ක්‍රියාවට නැංවීම සඳහා උපක්‍රම ගණනාවක් අනුගමනය කරයි.

- බලපෑම් කිරීම
- ප්‍රතිපාදන දීම
- දඬුවම කිරීම
- බලය යෙදවීම

ඕනෑම රටක ජාතික අභිලාෂ ගණනාවක් තිබේ.

- ජාතික ආරක්ෂාව තහවුරු කිරීම
- ජාතික ආර්ථිකය ඉහළ නැංවීම
- ජාතික සුබසාධනය දියුණු කිරීම
- ජාතික දේශපාලන මතවාදය සුරැකීම
- ජාතික අභිමානය සුරැකීම

රාජ්‍යයක් සිය ජාතික අභිලාෂ මුදුන් පමුණුවා ගැනීමට උපක්‍රම රැසක් අනුගමනය කරයිග

- රාජ්‍ය තාන්ත්‍රික සබඳතාර (තානාපති සේවය)
- ප්‍රචාරණය
- ආර්ථික උපාය මාර්ග (ණය, ප්‍රදාන, ආධාර)
- සන්ධාන ගත වීම (ගිවිසුම්)
- යුද්ධය

ඉහත තොරතුරු අනුව ජාත්‍යන්තර දේශපාලනයේ ජාතික බලය සහ ජාතික අභිලාෂ යන කාරණා අතිශය වැදගත් බව පැහැදිලි වේ.

**(ii). රාජ්‍ය ප්‍රතිපත්ති හා අධිකරණය** **(ලකුණු 10)**

- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමය තුළ නිතර අවධානය යොමු නොවන එහෙත් ඒ සම්බන්ධ ව වැදගත් ආයතනයක් ලෙස අධිකරණය හැඳින්විය හැකි ය.
- ප්‍රතිපත්ති සම්බන්ධ නෛතික ගැටලු ඇති වූ විට ඒවා අර්ථකථනය කරන්නේත්, ඒවායේ ව්‍යවස්ථානුකූල බව පරීක්ෂා කරන්නේත් අධිකරණය යි.
- එබැවින් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයෙහි ලා අධිකරණයට ද, ප්‍රතිපත්ති දායකත්වය හා ක්‍රියාවලිය තීරණය කිරීමෙහි ලා සැලකිය යුතු අධිකාරි බලයක් හිමි වේ.
- යම් නීතියක් රටේ මූලික ව්‍යවස්ථාවට අනුකූල නොවේ යැයි අධිකරණය තීරණය කළහොත් ප්‍රතිපත්තිය එතෙකින් අවසන් වේ.

- මේ බලය අධිකරණයට හිමි වන්නේ අධිකරණ විමර්ශන බලය හිමි ව තිබේ නම් පමණි. එසේ ම ඇතැම් රාජ්‍යවල අධිකරණයට, පනත් කෙටුම්පත් අවස්ථාවේ දී ප්‍රතිපත්තියේ ආකෘතිය හැඩගැස්වීමෙහි ලා උපදේශාත්මක බලයක් හිමි ව තිබේ. (උදාහරණ දක්වමින් විස්තර කරන්න)

**(iii). ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවණතා (ලකුණු 10)**

විදේශ ප්‍රතිපත්තියක් යනු රාජ්‍යයක් කුමන රාජ්‍යයක් සමඟ සම්බන්ධ වන්නේද, ඒ මගින් කුමන අරමුණු ඉටු කරගැනීමට ක්‍රියා කරන්නේ ද, ඒ සඳහා කුමන උපක්‍රම භාවිත කරන්නේ ද යන්නයි.

- ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය එක් එක් කාලවල පැවැති ආණ්ඩු අනුව වෙනස් වී ඇත.
- 2015 - 2020 අතර පැවති එක්සත් ජාතික පක්ෂ ප්‍රමුඛ ආණ්ඩු විදේශ ප්‍රතිපත්තියේ නව ප්‍රවණතා වූයේ,

  - බටහිර යුරෝපා රාජ්‍යයන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම

    උදා -බ්‍රිතාන්‍ය, ජර්මනිය, බෙල්ජියම, ප්‍රංශය, ඉතාලිය

  - IMF, WB, ADB, WTO, WEF වැනි ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග සමීපව සම්බන්ධ වෙමින් ණය ආධාර ලබා ගැනීම

  - ඉන්දියාව සමග සමීප සම්බන්ධතා පැවැත්වීම.

  - 2015 මුල්කාලීනව චීනය සමඟ සම්බන්ධතා අඩු වුව ද 2018 පමණ වන විට චීනය සමග සම්බන්ධතා යළි වර්ධනය වීම.

    උදා - 1.වරාය නගර ව්‍යාපෘතිය චීනයට නැවත ලබා දීම

    2.හම්බන්තොට වරාය චීනයට බදු දීම.

- 2020-2024 කාලය තුළ පැවැති ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණු ආණ්ඩුව

  - 2020-2022 කාලය තුළ බටහිර රටවල් සමග ශ්‍රී ලංකාවේ සම්බන්ධතා ඉතා අඩුවීම.

  - ඉන්දු - ලංකා සබඳතා චීන - ලංකා සබඳතා කිසියම් මට්ටමක පැවතීම.

  උදා - චීන සමාගමකින් කාබනික පොහොර නැවක් ගෙන්වා ගෙන මිලදී නොගෙන සිටීම නිසා චීනය විසින් ලංකාවේ මහජන බැංකුව අසාදු ලේඛනගත කිරීම.

  - COVID - 19 වසංගත සමයේ චීනය,ඉන්දියාව,ජපානය යන රටවල් විසින් ලංකාවට එන්නත් ලබාදීම.

- 2022 දී රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති වීමෙන් පසු නැවත බටහිර රටවල් සමග සම්බන්ධතා ඉහළ යාම.(IMF,WB වැනි ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ සම්බන්ධතා වර්ධනය වීම)
- 2022 දී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා ඉන්දියාව මූල්‍ය සහයෝගය ලබාදීම.
- 2024 දී ජාතික ජන බලවේග ආණ්ඩුවද IMF සමග මූල්‍ය සම්බන්ධතා පවත්වමින් විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු දක්නට ලැබීම.
- වර්තමානය තුළ ද ඉන්දියාව සමඟ සමීප විදේශ සම්බන්ධතා පවත්වනු ලබන ආකාරය දැකිය හැකිය.

  උදා -2025 ඉන්දීය අග්‍රාමාත්‍යවරයා ලංකාවේ නිල සංචාරයක නිරත වීම සහ ගිවිසුම් කිහිපයකට යොමුවීම.

  - 2026 දී ශ්‍රී ලංකාව ජනාධිපති ඉන්දියාවේ සංචාරයක නිරත වීම.

ආදී ලෙස ප්‍රායෝගික උදාහරණ දක්වමින් කරුණු සාකච්ඡා කර තිබිය යුතුය.

**(iv). බලපෑම් කණ්ඩායම්** **(ලකුණු 10)**

- ප්‍රජාතන්ත්‍රවාදී රටක පවතින දේශපාලන ආයතන විශේෂයක් ලෙස බලපෑම් කණ්ඩායම් හඳුනාගත හැකි ය. පෞද්ගලික අරමුණු ඉටු කර ගැනීම සඳහා පවතින ආණ්ඩුවට බලපෑම් කිරීමට ඒකරාශී වූ පුද්ගල කණ්ඩායම ලෙස හඳුනාගත හැකිය.
  උදා - ගොවි සංගමය, වැවිලිකරුවන්ගේ සංගමය, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය
- බලපෑම් කණ්ඩායම් තම අරමුණු ඉටුකර ගැනීම සඳහා ආණ්ඩුවට බලපෑම් කිරීමට පහත ක්‍රියාමාර්ග භාවිතයට ගනී
  උදා- උද්සෝෂණ, වැඩවර්ජන, සත්‍යග්‍රහ, සන්දේශ යැවීම
- ප්‍රජාතන්ත්‍රවාදී ආයතන විශේෂයකි
- යුරෝපීය හා ඇමෙරිකා සමාජයන් තුළ වැඩි වශයෙන් සාකච්ඡාවේ
  - බ්‍රිතාන්‍යයේ - බලපෑම් කණ්ඩායම්
  - ඇමරිකා එක්සත් ජනපදය - ආශා කණ්ඩායම් (අභිලාෂ කණ්ඩායම්) ලොබි කණ්ඩායම්
- වෘත්තීය සමිති බලපෑම් කණ්ඩායම් ලෙස නොසැලකේ
- දේශපාලන පක්ෂ හා බලපෑම් කණ්ඩායම් අතර වෙනස්කම් ගණනාවක් ඇත

බලපෑම් කණ්ඩායම් පැවතීමේ වාසි

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදනයට තොරතුරු ලබාදෙමින් ප්‍රතිපත්ති සම්පාදනයට හවුල් වීම
- සමකාලීන ප්‍රශ්න පිළිබඳව ජනතාව අවදියෙන් තැබීම
- ආණ්ඩුවේ හිතුවක්කාරී තීරණ හා චර්යාවන් සංවරණයට ලක් කිරීම
- ප්‍රජාතන්ත්‍රවාදී ශක්තිමත් කිරීම
- දේශපාලන පක්ෂ විසින් අවධාරණය නොකරන ප්‍රශ්න කෙරෙහි සමාජය හා ආණ්ඩුව දැනුවත් කිරීම
- දේශපාලන පක්ෂවලට ඌන පූරකයක් ලෙස කටයුතු කිරීම

අවාසි

- බලපෑම් කණ්ඩායම්වලට බැඳෙන්නෙත් නායකත්වය ලබාදෙන්නෙත් ප්‍රභූ ස්ථරයන් වීම
- පටු අවශ්‍යතා නියෝජනය කරන නිසා වැඩි දෙනාගේ යහපත උදා නොවීම
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ආවෘත කිරීමට හේතුවීම
- ජනතාව වෙතින් සුජාත බලයක් නොලැබීම
- දේපළ, ජීවිත විනාශ වීමටත් රටේ ආර්ථික තත්ත්වය බිඳ වැටීමටත් හේතු වීම

**(v). මැදිහත්කරණය** **(ලකුණු 10)**

මැදිහත්කරණය යනු ගැටුමට සම්බන්ධ පාර්ශ්ව අතර විවාදයට තුඩු දී ඇති නිමිති සම්බන්ධයෙන් දෙපාර්ශ්වයට ම පිළිගත හැකි නිරාකරණයක් ඇති කිරීමේ අරමුණින් තුන්වැනි පාර්ශ්වයක් භාරගෙන ලිබෙන අතරමැදි ක්‍රියාකාරකමකි. මැදිහත්කරණය එක අවස්ථාවක සිදුවන එක ක්‍රියාකාරකමක් නොව ක්‍රියාවලියකි. එය අවධි කීපයකින් යුක්ත වේ.

- මුල දී ගැටුම් පාර්ශව අතර පණිවිඩකරුවකු ලෙස ක්‍රියා කිරීම.
- ඔවුන් අතර සාධනීය අදහස් හුවමාරුවකට අවශ්‍ය සන්නිවේදන මාධ්‍යය වීම හා ඒ සඳහා ආධාර සැපයීම.
- ගැටුමට විකල්ප විසඳුම් ගැන සිතීමට ආධාර වීම.
- ගැටුමේ පාර්ශ්ව සාකච්ඡා මේසයට ගෙන ඒම සහ සාකච්ඡාවල සභාපති කාර්ය ඉටු කිරීම.
- සහමන්ත්‍රණයේ දී ඇති වන ගැටලුකාරී කරුණු විසඳීමට පාර්ශ්වකරුවන්ට ආධාර කිරීම.
- සහමන්ත්‍රණයේ යෙදෙන පාර්ශවවල ප්‍රකාශකයා ලෙස කටයුතු කිරීම.
- සාම ගිවිසුම කෙටුම්පත් කිරීමට ආධාර කිරීම.
- සාම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට, පාර්ශවකරුවන් ඉල්ලා සිටින උදවු ලබා දීම.
  (මැදිහත්කරණයට ලෝකයේ ප්‍රායෝගික උදාහරණ දෙමින් සිසුවා විස්තර කළ යුතු ය)